# 2016 වර්ෂය සඳහා
# ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ
# කාර්ය සාධන වාර්තාව

ආචාර්ය ඒ.ජේ. සතරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

# தொகைமதிப்பு புள்ளிவிபரத் திணைக்களத்தின்
# 2016 ஆம் ஆண்டுக்கான
# செயலாற்றுகை அறிக்கை

கலாநிதி ஏ.ஜே. சத்தரசிங்க
பணிப்பாளர் நாயகம்

# PERFORMANCE REPORT
# OF THE
# DEPARTMENT OF CENSUS AND STATISTICS
# FOR THE YEAR 2016

**Dr. A.J. Satharasinghe**
**DIRECTOR GENERAL**

# අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ ජාතික සංඛ්‍යාන ආයතනය වන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම වන්නේ රජයට සහ වෙනත් දත්ත භාවිතා කරන්නන් හට අවශ්‍ය වන්නා වූ සංඛ්‍යාලේඛන රැස් කිරීම හා ප්‍රචලිත කිරීමයි. මෙරට ප්‍රජා විද්‍යාත්මක, සමාජ ආර්ථික තත්වයන්ගේ විවිධ අංශයන්හි දත්ත රැස් කිරීම සහ සම්පාදනය කිරීමේ වගකීම ඇතුළුව සංඛ්‍යාන සේවයේ අවශ්‍ය වන්නා වූ රාජ්‍ය ආයතන සඳහා වෘත්තීය මට්ටමේ නිලධාරීන් පුහුණු කිරීමේ හා අනුයුක්ත කිරීමේ කටයුතු ද එයට පැවරී ඇත. එයට අමතරව සංඛ්‍යාන කටයුතු සඳහා සහාය අවශ්‍ය ආයතනයන් සඳහා සංඛ්‍යාන උපදේශන සේවාවන් ද එමගින් ලබා දෙයි.

ගත වූ වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් භාරගත් බොහෝ කාර්යයන් ඉතාමත් සාර්ථක අයුරින් නිම කිරීමට හැකි වීම සතුටට කරුණකි.

ඉකුත් වර්ෂයෙහි ආරම්භ කළ කාර්යයන් තව දුරටත් අඛණ්ඩව ඉදිරියට ගෙන යෑමට බලාපොරොත්තු වන අතරම 2016 වර්ෂයේ ඉලක්කයන් සපුරා ගැනීම සඳහා වගකීමෙන් හා කැපවීමෙන් යුතුව වෙහෙස නොබලා කටයුතු කල දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය වෙත මාගේ අවංක ස්තුතිය පිරිනමමි. එසේම දෙපාර්තමේන්තුවේ ඉලක්කයන් සපුරා ගැනීම සඳහා සහයෝගය දුන් රාජ්‍ය, පෞද්ගලික හා වෙනත් ආයතන වෙත මෙන්ම මහජනතාව වෙතද මාගේ ස්තුතිය පිරිනමමි.



ආචාර්ය ඒ.ජේ. සතරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
"සංඛ්‍යාන මන්දිරය"
අංක 306/71, පොල්දූව පාර
බත්තරමුල්ල

දුරකථන අංකය : +94 11 2147001
ෆැක්ස් : +94 11 2147011
විද්‍යුත් ලිපිනය : dgcensus@statistics.gov.lk
වෙබ් අඩවිය : www.statistics.gov.lk

## පටුන

පිටුව


**1.** **හැඳින්වීම**……………………………………………………………………………… 1

**2.** **දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලබන කාර්යයන්** ……………………………………….. 1

**2.1** **දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන සහ සමීක්ෂණ**……………………… 1

2.1.1 රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳව සංගණනය - 2016…. 1

2.1.2 ආර්ථික සංගණනය - 2013/14……….................................................... 2

2.1.3 ගැටුම් හේතුවෙන් මියගිය/තුවාල ලැබූ පුද්ගලයින් හා දේපළ හානි පිළිබඳ සංගණනය - 2013……………………………………………..…… …. 2

2.1.4 පරිගණක සාක්ෂරතා සමීක්ෂණය……………………........……………3

2.1.5 ප්‍රජාවිද්‍යා හා සෞඛ්‍ය සමීක්ෂණය - 2016................................................... 3

2.1.6 ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය - 2016....................................................... 3

2.1.7 ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය - 2016.................................... 4

2.1.8 ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය - 2016...................................................... 4

2.1.9 වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය.......................................... 4

2.1.10 තේ, රබර්, පොල් නිෂ්පාදන වියදම් සමීක්ෂණය............................................ 5

2.1.11 කෘෂිකර්ම නිෂ්පාදන සමීක්ෂණය - 2016/17................................................ 5

2.1.12 කාර්මික නිෂ්පාදන පිළිබඳ ත්‍රෛයිමාසික සමීක්ෂණය - 2015......................... 5

2.1.13 අර්තාපල් නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීමේ සමීක්‍ෂණය - 2016.................... 5

2.1.14 ලොකු ළූණු නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීමේ විශේෂ සමීක්‍ෂණය - 2016…….6

2.1.15 වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය - 2015............................................ 6

2.1.16 වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය - 2015...................................................... 6

2.1.17 වාර්ෂික වෙළඳ හා සේවා සමීක්ෂණය - 2016............................................... 6

2.1.18 පරීක්ෂණාත්මක මිලදී ගැනීම් සමීක්ෂණය.................................................. 6

**2.2** **මෙරට සමාජ ආර්ථික දත්ත එක්රැස් කිරීම සහ සකස් කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මගින් ඉටුකල අනෙකුත් සංඛ්‍යානමය කටයුතු**............................................................... 7

2.2.1 වී පිළිබඳ සංඛ්‍යාලේඛන.............................................................................. 7

2.2.2 ප්‍රජාවිද්‍යා සංඛ්‍යාති..................................................................................... 7

2.2.3 ගොඩ ගොවිතැන් සංඛ්‍යාලේඛන.................................................................. 7

2.2.4 සත්ත්ව සංඛ්‍යාති එක් රැස් කිරීම - 2016................................................... 7

2.2.5 මස් පිණිස මරණ ලද සතුන්ගේ සංඛ්‍යාලේඛන............................................ 8

2.2.6 ආහාර ශේෂ පත්‍රය....................................................................................... 8

2.2.7 ජාතික ගිණුම්.............................................................................................. 8

2.2.8 ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) (පදනම 2013 = 100).................... 9

2.2.9 දිස්ත්‍රික් නාගරික සිල්ලර සහ නිෂ්පාදකයාගේ මිල ගණන් රැස් කිරීම................ 10

2.2.10 නිෂ්පාදකයාගේ මිල දර්ශකය (PPI) (පදනම 2013 Q4=100)......................... 11

2.2.11 ජාත්‍යන්තර සංසංදනාත්මක වැඩසටහන (ICP).......................................... 12

2.2.12 පළාත් පාලන සංඛ්‍යාති........................................................................ 12
2.2.13 පර්යේෂණ හා විශේෂ අධ්‍යයන කටයුතු...................................................... 12
2.2.14 ව්‍යාපාර පිළිබඳ සංඛ්‍යාන නාමාවලිය......................................................... 13
2.2.15 ගොඩනැගිලි සංඛ්‍යාලේඛන..................................................................... 14
2.2.16 කාර්මික නිෂ්පාදන දර්ශකය (IIP)............................................................ 14
2.2.17 පුහුණු කටයුතු......................................................................................... 14
2.2.18 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කටයුතු.............................................. 15
2.2.19 ප්‍රකාශන කටයුතු...................................................................................... 17
2.2.20 මුද්‍රණ කටයුතු.......................................................................................... 17
2.2.21 සිතියම් විද්‍යා කටයුතු................................................................................ 18
2.2.22 දත්ත නිකුත් කිරීමේ කටයුතු...................................................................... 19
2.2.23 පුස්තකාල සේවා....................................................................................... 20
2.2.24 ක්ෂේත්‍ර කළමණාකරණ කටයුතු................................................................. 21

**2.3 අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ස්ථාපිත කර ඇති සංඛ්‍යාලේඛන ශාඛා කාර්යාල මගින් පවත්වනු ලබන සංගණන සහ සමීක්ෂණ**.................................................. 22

2.3.1 වාර්ෂික රැකීරක්ෂා සමීක්ෂණය................................................................ 22
2.3.2 සාමාන්‍ය ඉපැයීම් සහ වැඩ කල පැය ගණන පිළිබඳ සමීක්ෂණය................. 22
2.3.3 පඩිපාලක සහා අවම වැටුප් දර්ශකාංකය ගණනය කිරීම............................ 22
2.3.4 කම්කරු සංඛ්‍යාති ප්‍රකාශනය ප්‍රකාශයට පත් කිරීම.................................... 22
2.3.5 අධ්‍යාපන සංඛ්‍යාති..................................................................................... 23
2.3.6 වෛද්‍ය සංඛ්‍යාති........................................................................................ 23
2.3.7 ජීව සංඛ්‍යාති............................................................................................. 24
2.3.8 රේගු සංඛ්‍යාති........................................................................................... 24
2.3.9 ධීවර සංඛ්‍යාති........................................................................................... 24

**3. පරිපාලනය**.................................................................................................. 25

**3.1 අංශ, ශාඛා කාර්යාල හා දිස්ත්‍රික් කාර්යාල**.................................................. 25

3.1.1 අංශ සහ ඒකක.......................................................................................... 25
3.1.2 අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල පිහිටි ශාඛා කාර්යාල............................ 25
3.1.3 දිස්ත්‍රික් කාර්යාල...................................................................................... 25
3.1.4 පළාත් සභාවල සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලය.......................................... 26

**3.2 කාර්ය මණ්ඩලය**.......................................................................................... 26

**3.3 විදේශ සම්මේලන, සම්මන්ත්‍රණ හා වැඩමුළුවලට සහභාගීවීම - 2016**.............. 28

**3.4 උසස්වීම්, පත්වීම්, මුදාහැරීම්, ඉල්ලා අස්වීම්, සේවය අතහැරයෑම් හා විශ්‍රාමයෑම්**............ 33

**3.5 අභ්‍යන්තර විගණන කටයුතු**........................................................................... 34

**4. මූල්‍ය වාර්තාව - 2016**.................................................................................. 35

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2016

## 1. හැඳින්වීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව රටේ සංවර්ධනය සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා සැලසුම් සකස් කිරීමට අවශ්‍ය දත්ත සැපයීම සඳහා වූ වගකීම් දරණ මධ්‍යම රජයේ ආයතනයක් වේ. තවද, ශිෂ්‍යයන්ගේ සිට ජාත්‍යන්තරය දක්වා දත්ත භාවිතා කරන්නන් ගේ ඉල්ලුම සඳහා වූ පුළුල් පරාසයක දත්ත අවශ්‍යතාව දෙපාර්තමේන්තුව සපුරාලනු ලැබේ. දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන හා සමීක්ෂණ පදනම්ව ආර්ථිකයේ කෘෂිකර්මය, කර්මාන්ත, වෙළඳාම, ජනගහනය, ජාතික ආදායම හා අනෙකුත් ප්‍රජා විද්‍යාත්මක තොරතුරු කාලීනව රැස් කිරීම තුලින් ඉහත අවශ්‍යතා ඉටු කර දීමට දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් කටයුතු කරයි.

**දැක්ම**

දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා කාලීන තොරතුරු ලබා දීම තුලින් කලාපයේ පෙර ගමන්කරු බවට පත්වීම.

**මෙහෙවර**

ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය, සේවක කැපවීම සහ උපායශීලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි වූත් දත්ත ලබා දීම මඟින් වඩාත් ඵලදායී ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම

## 2. දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලබන කාර්යයන්

දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලබන කාර්යයන් පුළුල් වශයෙන් පහත දැක්වේ.

2.1 දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන සහ සමීක්ෂණ

2.2 මෙරට සමාජ ආර්ථික දත්ත එක්රැස් කිරීම සහ සකස් කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මගින් ඉටු කල අනෙකුත් සංඛ්‍යානමය කටයුතු

2.3 ඇතැම් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ස්ථාපිත කර ඇති සංඛ්‍යාලේඛන ශාඛා කාර්යාල මගින් පවත්වනු ලබන සංගණන, සමීක්ෂණ සහ අනෙකුත් සංඛ්‍යානමය කටයුතු

## 2.1 දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සංගණන සහ සමීක්ෂණ

### 2.1.1 රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳව සංගණනය - 2016

රටේ ප්‍රතිපත්ති සම්පාදනයට සහ ශ්‍රම බල සැලසුම් කිරීමට අවශ්‍ය රාජ්‍ය අංශයේ (මධ්‍යම රජයේ සහ පළාත් රාජ්‍ය) සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳව සහ එම නිලධාරීන්ගේ ප්‍රජා විද්‍යාත්මක හා සමාජ ආර්ථික තොරතුරු පිළිබඳව නිවැරදි සංඛ්‍යාලේඛන රැස් කිරීම සඳහා මෙම සංගණනය සැලසුම් කරන ලදී. මෙම සංගණනයට අදාලව සංගණන උපදෙස් සකස් කිරීම, කේත ලැයිස්තු සකස් කිරීම, මධ්‍යම රජය/ පළාත් රාජ්‍ය අංශය/අර්ධ රාජ්‍ය අංශය ආවරණය වන පරිදි ආයතන 10 ක් පමණ තෝරා ගෙන සංගණන ප්‍රශ්නාවලිය පූර්ව පරීක්ෂාවන්ට ලක් කිරීම හා ඒ අනුව ප්‍රශ්නාවලියේ සංශෝධන සිදු කිරීම, සියලුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන නියෝජනය වන සේ සංගණන සම්බන්ධීකරණ නිලධාරීන්/සහකාර සම්බන්ධීකරණ නිලධාරීන් පත් කර එම නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම සහ එම නිලධාරීන්ගේ සහයෝගයෙන් සංගණන රාමුව සකස් කිරීම යනාදිය සංගණන පූර්ව සැලසුම් කටයුතු ලෙස මෙම වර්ෂය තුලදී සැලසුම් කරන ලදී. දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාල පරිශ්‍ර, දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍ර හා පළාත්

සහා පරිශ්‍ර තුල සේවකයින් වැඩි සංඛ්‍යාවක් සිටින තෝරා ගත් ආයතන වල සංගණන පුහුණු වැඩසටහන් 100 ක් පමණ පවත්වා සම්පූර්ණ සංගණන ක්‍රියාවලිය පිළිබඳව ආයතන දැනුවත් කිරීමෙන් පසු 2016 නොවැම්බර් මස 17 වන දින රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සියලු ආයතන තුළ දීප ව්‍යාප්තව සංගණනය පවත්වන ලදී. මෙම සංගණනයේදී සේවා නියුක්තිය පිළිබඳ තොරතුරු රැස් කිරීමට සමගාමීව සෑම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනකම ආයතනික වත්කම්, එනම් ආයතනය සතු ඉඩම්, ගොඩනැගිලි, වාහන සහ උපකරණ පිළිබඳව සාරාංශ තොරතුරු ලැයිස්තුගත කිරීමද සිදු කරන ලදී.

මෙම සංගණනයට අදාලව රේඛීය අමාත්‍යාංශ, පළාත් ප්‍රධාන ලේකම් කාර්යාල සහ පළාත් අමාත්‍යාංශ, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ අමාත්‍යාංශයක් යටතට අයත් නොවන ආයතන විසින් සකස් කරන ලද R4 සාරාංශ වාර්තා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට එක් රැස් කිරීමේ කටයුතු ද මෙම වර්ෂය තුළ ආරම්භ කරන ලද අතර මෙම සාරාංශ වාර්තා වලින් 60% ක් පමණ මෙම වර්ෂය තුලදී එක් රැස් කර ගැනීමට හැකි විය.

සංගණන දත්ත විශ්ලේෂණය, මූලික වාර්තාව සහ අවසාන වාර්තා ප්‍රකාශයට පත් කිරීම 2016 වර්ෂය තුළ සිදු කිරීමට සැලසුම් කර තිබුනද 2016 වර්ෂයට අදාල ක්‍රියාකාරි සැලැස්ම ඉදිරිපත් කිරීමෙන් පසු සංගණන ක්‍රම වේදය වෙනස් කිරීම හේතුවෙන් පූර්ව සංගණන කටයුතු සහ සංගණන කටයුතු සඳහා වැඩි කාලයක් යෙදවීමට සිදු වීම නිසා එම කටයුතු 2016 වර්ෂය තුලදී නිම කිරීමට නොහැකි විය.

### 2.1.2 ආර්ථික සංගණනය – 2013/14

#### I. කෘෂිකර්ම අංශයේ ගණන් ගැනීම

ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයේ ඇති ව්‍යුහාත්මක වෙනස්කම් හඳුනා ගැනීම සඳහා කෘෂිකර්ම, කර්මාන්ත, වෙළඳ හා සේවා යන ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි ආර්ථික සංගණනය පවත්වන ලදී.

මෙම සංගණනය යටතේ කෘෂිකර්ම අංශයේ තොරතුරු රැස් කිරීම මූලිකව අදියර 2 කින් සිදු කරන ලදී. පළමු අදියර යටතේ ශ්‍රී ලංකාවේ අක්කර 20 ට වැඩි සියලුම වතු ලැයිස්තු ගත කළ අතර එම තොරතුරු මත පදනම් වූ වාර්තාවක් දැනටමත් ප්‍රකාශයට පත් කර ඇත. අනතුරුව දෙවන අදියර යටතේ කෘෂිකර්මාන්තයට අදාළ සියලුම ඒකක පිළිබඳ විස්තරාත්මක තොරතුරු රැස් කරන ලදී. ඒ අනුව මෙම අදියර යටතේ සියලුම වතු හා කුඩා ගොවිකාණ්ඩ ආවරණය කරමින් ගොවි කාරකයින්, ගොවි කාරකයාගේ ගෘහ කාණ්ඩය, ඉඩම් භාවිතය හා භුක්තිය, ස්ථිර බෝග, කාලීන බෝග යටතේ වගා කොට ඇති බිම් ප්‍රමාණ, සත්ව පාලනය, මිරිදිය/කිවුල්දිය/කරදිය මත්ස්‍ය වගාව, ආදී විෂයයන්ට අදාල තොරතුරු රැස් කරන ලදී.

මෙම සංගණනයේදී රැස් කළ තොරතුරු භාවිතයෙන් පිළියෙල කළ වාර්තා කිහිපයක් දැනටමත් නිකුත් කර ඇත. ඒ අනුව වතු පිළිබඳ සාරාංශ වාර්තාව, ක්ෂේත්‍රයේ දත්ත රැස් කරන අවස්ථාවේ පිළියෙල කරන ලද සාරාංශ වාර්තා ඇසුරෙන් කුඩා ගොවිකාණ්ඩ පිළිබඳ මූලික වාර්තාව, හා මන්නාරම,මුලතිව්, කිලිනොච්චි දිස්ත්‍රික් වාර්තාවන් ද මේ වනවිට දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කර ඇත. අනෙකුත් දිස්ත්‍රික් වාර්තා හා අවසන් වාර්තාව 2017 වර්ෂය තුල නිකුත් කිරීමට සැලසුම් කර ඇත.

#### II. කෘෂිකාර්මික නොවන අංශයේ ගණන් ගැනීම

කෘෂිකාර්මික නොවන අංශය, ලැයිස්තු ගත කිරීමේ අදියර හා විස්තරාත්මක තොරතුරු රැස්කිරීමේ අදියර ලෙස අංශ 2ක් යටතේ ආවරණය වේ. සියළුම මහා පරිමාන ආයතනවල හා කුඩා මධ්‍ය පරිමාන ආයතන නියැදියක විස්තරාත්මක තොරතුරු රැස් කර ඇත.

වර්ෂයේ නියමිත කාලවකවානුවට කර්මාන්ත අංශයේ දත්ත වාර්තාව නිකුත් කර ඇති අතර වෙළඳ හා සේවා අංශයේ දත්ත වාර්තාව සකස් කරමින් පවතින අතර අවිධිමත් අංශයේ දත්ත විශ්ලේෂණ අදියරේ පවතී.

### 2.1.3 ගැටුම් හේතුවෙන් මියගිය තුවාල ලැබූ පුද්ගලයින් හා දේපළ හානි පිළිබඳ සංගණනය - 2013

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ඒකාබද්ධ ව 2013 වර්ෂයේදී මෙම සංගණනය පවත්වන ලදී. සංගණන දත්ත වල නිරවද්‍යතාවය තහවුරු කිරීම, දත්ත විශ්ලේෂණය සහ අවසන් වාර්තාව ප්‍රකාශයට පත් කිරීම 2016 වර්ෂයේදී සිදු කිරීමට සැලසුම් කරන ලදී. සංගණනයේදී එක්රැස් කරන ලද දත්ත අතරින් ගැටුම් හේතුවෙන් මියගිය/තුවාල ලැබූ පුද්ගලයන්ට අදාල දත්ත වල නිරවද්‍යතාවය තහවුරු කර දත්ත විශ්ලේෂණ කටයුතු නිම කිරීමෙන් පසු එම දත්ත අනුසාරයෙන් සංගණන අවසන් වාර්තාව සකස් කරමින් පවතී.

### 2.1.4 පරිගණක සාක්ෂරතා සමීක්ෂණය

අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ඒකාබද්ධව පාසල් සිසුන්ගේ සහ ගුරුවරුන්ගේ පරිගණක සාක්ෂරතාවය මැනීම සඳහා ශ්‍රී ලංකාවේ රජයේ පාසල් සහ රජයේ අනුමත පුද්ගලික පාසල් වල 2014 වර්ෂයේදී මෙම සමීක්ෂණය පවත්වන ලදී. සමීක්ෂණය සඳහා තාක්ෂණික සහාය ලබා දීම මෙම දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන අතර දත්ත පරිගණකගත කිරීම සඳහා අවශ්‍ය පරිගණක වැඩසටහන් සකසා දීම සහ දත්ත පරිගණකගත කිරීමේ අනෙකුත් කටයුතු සඳහා තාක්ෂණික සහාය ලබා දීම 2016 වර්ෂයේදී ද අඛණ්ඩව සිදු කරන ලදී.

### 2.1.5 ප්‍රජාවිද්‍යා හා සෞඛ්‍ය සමීක්ෂණය - 2016

දෙපාර්තමේන්තුව මගින් CAPI (Computer Assisted Personal Interviewing) ක්‍රමවේදය භාවිතා කරමින් පවත්වන ලද ප්‍රථම සමීක්ෂණය ලෙස ප්‍රජාවිද්‍යා හා සෞඛ්‍ය සමීක්ෂණය - 2016 හැඳින්විය හැක. මේ සඳහා අන්තර් ජාතික සහයෝගය ලබා ගනු ලැබූ අතර සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉල්ලීම මත මෙම සමීක්ෂණය 2016 වසරේ පවත්වන ලදී. සමීක්ෂණ කටයුතු සඳහා කාර්යාල උපකරණ හා ටැබ්ලට් උපකරණ මිලදී ගැනීම, ප්‍රතිචාරක හා දරුවන් දිරිමත් කිරීම සඳහා භාණ්ඩ හා වෛද්‍ය උපකරණ මිලදී ගැනීම , ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා අදාල ප්‍රසම්පාදන කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශයේ ව්‍යාපෘති කාර්යාලය මගින් සිදු කරන ලදී. සමීක්ෂණයේ උපලේඛනය සැකසීම, CAPI තාක්ෂණය සඳහා අදාල පරිගණක වැඩසටහන ඇතුලත් කිරීම, ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කිරීම, ද්විතියික දත්ත සංස්කරණය සිදු කිරීම ICF ජාත්‍යන්තර ආයතනයේ උපදෙස් හා මග පෙන්වීම යටතේ සිදු කරන ලදී. සමීක්ෂණය සඳහා වූ ක්ෂේත්‍රයේ දත්ත රැස් කිරීම හා දත්ත ප්‍රධාන කාර්යාලය වෙත ලබා ගැනීම අවසන් කර ඇති අතර මූලික හා අවසන් වාර්තාව සකස් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. මේ වන විට, දත්ත ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රියාවලිය සැලසුම් කරමින් පවතී.

### 2.1.6 ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය - 2016

අවු. 5 - 17 වයස් සීමාව තුළ සිටින සියළුම ළමයින්ගේ ආර්ථික ක්‍රියාකාරකම් ආවරණය කිරීම අරමුණු කොට ගෙන ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය පවත්වනු ලැබේ. 2016 වසරේදී කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) තාක්ෂණික හා මූල්‍ය සහයෝගිතාවයෙන්, සමස්ථ දිවයිනම ආවරණය වන පරිදි තෝරාගත් නිවාස ඒකක 25,000 ක නියැදියක් භාවිතයෙන් මෙම සමීක්ෂණය පවත්වන ලදී.

2016 මැයි මාසය වන විට මෙම සමීක්ෂණයේ ක්ෂේත්‍ර කටයුතු අවසන් කරන ලදී. රැස් කරන ලද දත්ත පරිගණකගත කිරීම හා සංස්කරණය කිරීමෙන් අනතුරුව නියමිත කාලපරිච්ඡේදය තුලදී අවසන් දත්ත ගොනුවේ දළ වගුගත කිරීමේ (rough tables) වාර්තාව ජාත්‍යන්තර කම්කරු සංවිධානයට (ILO) ඉදිරිපත් කර අවසන් වාර්තාවේ විශ්ලේෂණ කටයුතු අවසන් කර ඇත.

### 2.1.7 ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය - 2016

රට තුල සිදුවී ඇති සමාජ හා ආර්ථික වෙනස්කම් අධ්‍යයනය කිරීම උදෙසා ගෘහ ඒකකවල ආදායම් හා වියදම් පිළිබඳ පරිපූර්ණ තොරතුරු ලබා ගැනීමේ අරමුණින් සෑම වසර 03කට වරක් මෙම සමීක්ෂණය පවත්වනු ලැබේ. දිළිඳු ජන කොටස් හඳුනා ගැනීමටත්, එම ජනයා සවිබල ගැන්වීම සඳහා රජයට හා වෙනත් ආයතනවලට වැඩසටහන් සම්පාදනය කිරීමට හා ප්‍රතිපත්තිමය තීරණ ගැනීමටත් මෙම සමීක්ෂණය මගින් රැස් කරන තොරතුරු වැදගත් වේ.

ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ හතරවන කාර්තුවේ ක්ෂේත්‍ර කටයුතු අවසන් කර ඇත. නියමිත කාලවකවානුවට අදාලව දත්ත පරිගනකගත කිරීම දිස්ත්‍රික් කාර්යාලවලදී සිදු කර අවසන් අතර ඉලක්කගත පරිදි පරිගණක ගතකල දත්ත සංස්කරණය හා පිරිසිදු කිරීමේ කටයුතු ද අංශය මඟින් අවසන් කර ඇත.

### 2.1.8 ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය - 2016

සේවා නියුක්තිය, සේවා වියුක්තිය ඇතුළු ශ්‍රමබලයට සම්බන්ධ විවිධ කරුණු සහ ඒවායේ කාලානුරූපව සිදුවන වෙනස්වීම් පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම සමීක්ෂණයේ අරමුණයි. ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණය 1990 වසරේ සිට වාර්ෂිකව නොකඩවා ක්‍රියාත්මක කරනු ලබන අතර මෙමගින් වාර්ෂික හා කාර්තුමය දත්ත නිකුත් කෙරේ.

ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණයේ හතරවන කාර්තුවේ ක්ෂේත්‍ර කටයුතු ද සම්පූර්ණ කර ඇත. නියමිත කාලවකවානුවට අදාලව දත්ත පරිගණකගත කිරීම, සංස්කරණය හා පිරිසිදු කිරීමේ කටයුතු දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලදී සිදු කර ඇති අතර ඒවායේ නිරවද්‍යතාවය තහවුරු කර තිබේ. එසේම, කාර්තුවලට අදාල වාර්තා සැකසීම, නිකුත් කිරීම හා වෙබ් අඩවියේ පළ කිරීම නියමිත කාලය තුළ සිදු කර තිබේ.

කොරියානු රජයේ ආධාර යටතේ සිදු කරනු ලබන KOSTAT ව්‍යාපෘතිය තුලින් ශ්‍රී ලංකා ශ්‍රමබල සමීක්ෂණයේ ක්ෂේත්‍ර කටයුතු 2017 වර්ෂයේ සිට CAPI ක්‍රමවේදය යටතේ ටැබ්ලට් පරිගණක භාවිතයෙන් සිදු කිරීමට අපේක්ෂිතය. 2016 වර්ෂය තුලදී මෙහි සැලසුම් කටයුතු හා නියමු සමීක්ෂණ කටයුතු අවසන් කරන ලදී.

**වගුව 1 : ශ්‍රී ලංකාවේ ශ්‍රම බල සමීක්ෂණය 2016**

| දර්ශකය | ශ්‍රී ලංකාව | පුරුෂ | ස්ත්‍රී |
|---|---|---|---|
| ශ්‍රම බලකාය(වයස අවු :15 හා ඊට වැඩි ) ('000) | 8,311 | 5,304 | 3,007 |
| සේවා වියුක්ති ජනගහනය ('000) | 363 | 154 | 209 |
| ශ්‍රමබල සහභාගීත්ව අනුපාතිකය (%) | 53.8 | 75.1 | 35.9 |
| සේවා වියුක්ති අනුපාතිකය (%) | 4.4 | 2.9 | 7.0 |

### 2.1.9 වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය

2015/2016 මහ කන්නය හා 2016 යල කන්නය සඳහා වී වගා කරන ලද බිම් ප්‍රමාණය, සාමාන්‍ය අස්වැන්න සහ මුළු නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීම මෙම සමීක්ෂණය මගින් සිදු කරයි. 2015/2016 මහ කන්නය හා 2016 යල කන්නය සඳහා ඒ ඒ දිස්ත්‍රික්කවල වී වගා කෙරෙන වාරි ක්‍රමය නියෝජනය වන අකාරයට අක්කරයට/ හෙක්ටයාරයකට සාමාන්‍ය වී අස්වැන්න ඇස්තමේන්තු කිරීම ද මෙම සමීක්ෂණය මගින් සිදු කරයි.

මෙහිදී ජාතික මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් එක් එක් කන්නය තුළ වගා කරන ලද සහ අස්වැන්න නෙලා ගත් බිම් ප්‍රමාණයන් ගණනය කිරීමට වී අස්වැන්න ඇස්තමේන්තු කිරීම සඳහා වන සමීක්ෂණ පවත්වන්නට යෙදුනි. එමෙන්ම, මහවැලි බල ප්‍රදේශවල කුඩා කළමනාකරණ කොට්ඨාශ මට්ටමින්ද ඉහත දක්වන ලද සංඛ්‍යාතීන් පිළියෙල කිරීමට යෙදුනි.

ඒ අනුව 2015/2016 මහ කන්නය සඳහා වී වගා කරන ලද බිම් ප්‍රමාණය, සාමාන්‍ය අස්වැන්න සහ මුළු නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීම, හා 2016 යල කන්නය සඳහා ඉහත ඇස්තමේන්තු වලට අදාල තොරතුරු රැස් කිරීමට කටයුතු යොදන ලදී.

ඉහත සමීක්ෂණයට සමගාමීව වී වගාව පිළිබඳ උපාශ්‍රිත තොරතුරු වන එක් එක් වී වර්ග අනුව වගා කොට ඇති බිම් ප්‍රමාණයන් , බිම් සකස් කරන ලද ආකාරය, පොහොර භාවිතය, වල්නාශක භාවිතය වැනි විචල්‍යයන් පිළිබඳ දත්තයන්ද එක් රැස් කරන ලදී.

## 2.1.10 තේ, රබර්, පොල් නිෂ්පාදන වියදම් සමීක්ෂණය

2015/2016 වර්ෂ සඳහා තේ, රබර් සහ පොල් යන ප්‍රධාන භෝගයන්ගේ නිෂ්පාදන වියදම් ගණනය කිරීමේ කටයුතු අවසන් කරන ලදී. තේ කිලෝග්‍රෑමයක නිෂ්පාදන වියදම ගණනය කිරීමට අදාල විස්තරාත්මක තොරතුරු ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ, තේ කොමසාරිස් අංශයේ සහාය ඇතිව එම කාර්යාලයෙහි ලියාපදිංචි තේ කම්හල්වලින් එක් රැස් කරන ලදී. රබර් නිෂ්පාදන වියදම් ගණනය කිරීමේදී රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව පවත්වනු ලබන සමීක්ෂණය පදනම් කර ගනු ලැබීය. පොල් නිෂ්පාදන වියදම් ගණනය කිරීමේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන පොල් නිෂ්පාදන වියදම් සමීක්ෂණය පදනම් කර ගනු ලැබීය. මෙම සමීක්ෂණ මගින් ලබා ගන්නා දත්ත මගින් 2015/2016 වගා වර්ෂය සඳහා තේ, රබර් සහ පොල් වල නිෂ්පාදන වියදම් ගණනය කිරීමේ කටයුතු සිදු කරන ලදී.

## 2.1.11 කෘෂිකර්ම නිෂ්පාදන සමීක්ෂණය - 2016/17

කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ව්‍යුහාත්මක තත්ත්වය පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා අලුතෙන් සමීක්ෂණයක් සිදු කිරීමට මෙම වසරේ දී කෘෂිකර්ම හා පාරිසරික අංශය කටයුතු සිදු කරයි. ඒ අනුව කෘෂිකර්ම අංශයේ ගෘහ ඒකක වල ප්‍රජා විද්‍යාත්මක තොරතුරු, ඉඩම් භාවිතය, වගා ව්‍යුහය, සත්ව පාලනය, බෝග වගාව, වන වගාව, කෘෂිකාර්මික යෙදවුම්, නිෂ්පාදන වියදම හා තොග පවත්වා ගැනීම ආදී තොරතුරු රැස් කිරීමට මෙම සමීක්ෂණය සැලසුම් කර ඇත. ඒ අනුව සමීක්ෂණය සඳහා උපලේඛනය පිළියෙල කිරීමේ කටයුතු හා සමීක්ෂණය පැවැත්වීම පිළිබඳ අනෙකුත් මූලික සැලසුම් සිදු කර ඇත.

## 2.1.12 කාර්මික නිෂ්පාදන පිළිබඳ ත්‍රෛයිමාසික සමීක්ෂණය - 2015

කාර්මික නිෂ්පාදන ආයතනවල නිෂ්පාදන මට්ටම, අමුද්‍රව්‍ය පරිභෝජනය, යෙදවුම්, ඉපයීම් හා සේවා නියුක්තිය පිළිබඳ කාලීන තොරතුරු ලබා ගැනීම සඳහා මෙම සමීක්ෂණය සැලසුම් කර ඇත.

2015 වර්ෂයේ හතරවන කාර්තුව හා 2016 වර්ෂයේ පළමු, දෙවන හා තෙවන කාර්තු සඳහා ක්ෂේත්‍ර කටයුතු සිදුකර එම කාලපරිච්ඡේද සඳහා වර්ධක අනුපාතික ඇස්තමේන්තු කර ජාතික ගිණුම් අංශයට ලබා දීම සිදු කරන ලදී.

## 2.1.13 අර්තාපල් නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණය - 2016

අර්තාපල් වගා කරනු ලබන බිම් ප්‍රමාණය හා අපේක්ෂිත නිෂ්පාදනයන් මාසිකව පුරෝකථනය කිරීම ප්‍රධාන අරමුණ කොටගත් මෙම සමීක්ෂණය 2016 වසර තුලදී නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික්ක වල ප්‍රා.ලේ. කොට්ඨාස මට්ටමින් පහත සඳහන් අයුරින් සිදු කරන ලදී.

මෙම සමීක්ෂණය 2016 වර්ෂය තුල නුවරඑළිය දිස්ත්‍රික්කයෙහි අදියර තුනකින් ඉටුකරන ලද අතර, බදුල්ල දිස්ත්‍රික්කයෙහි අදියර දෙකකින් ඉටුකරන ලදී. එහි ක්ෂේත්‍ර කටයුතු ජනවාරි / පෙබරවාරි, අප්‍රේල් / මැයි සහ අගෝස්තු / සැප්තැම්බර් යන කාල වකවානු වල සිදු කරනු ලැබූ අතර එම සමීක්ෂණ ප්‍රතිඵල අනුව 2016

වර්ෂය සඳහා අර්තාපල් වගා කරනු ලබන බිම් ප්‍රමාණය හා අපේක්ෂිත නිෂ්පාදනයන් මාසිකව පුරෝකථනය කිරීම සිදු කරන ලදී.

### 2.1.14 ලොකු ළූණු නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීමේ විශේෂ සමීක්ෂණය - 2016

ලොකු ළූණු වගා කරන ගොවීන් සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය අනුව අපේක්ෂිත නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීමේ අරමුණින් යුතුව 2016 වසරේදී ද මෙම සමීක්ෂණය අනුරාධපුරය, පොළොන්නරුව, මාතලේ යන දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් හා මහවැලි ‘එච්‘ කලාපය තුළ ඒකක කළමනාකරණ කොට්ඨාස මට්ටමින් සිදු කරන ලදී.

ලොකු ළූණු නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීමෙහිලා පවත්වන මෙම සමීක්ෂණය යල කන්නය සඳහා සිදුකරන බැවින් එහි ක්ෂේත්‍ර කටයුතු 2016 වර්ෂය තුළ අගෝස්තු / සැප්තැම්බර් කාල වකවානුවේදී සිදු කරන ලදී.

එම සමීක්ෂණ ප්‍රතිඵල අනුව 2016 වර්ෂය සඳහා ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් හා මහවැලි ‘එච්‘ කලාපය තුළ ඒකක කළමනාකරණ කොට්ඨාස මට්ටමින්, ලොකු ළූණු වගා කරන බිම් ප්‍රමාණය හා අපේක්ෂිත නිෂ්පාදනය ඇතුලත් අවසන් වාර්තාව සකස් කරන ලදි.

### 2.1.15 වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමික්ෂණය - 2015

මෙම සමීක්ෂණය මගින් ඉදිකිරීම් කර්මාන්තයේ ව්‍යුහය සම්බන්ධ නිමානකයන් ලබා ගැනීම මෙන්ම ප්‍රතිපත්ති හා සැළසුම් සකස් කිරීමට අවශ්‍ය දත්ත ලබා ගැනීම සිදු කරනු ලබයි. ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය 2015 ට අදාලව ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණයට අදාළ ක්ෂේත්‍ර කටයුතු සිදු කිරීම, උපලේඛණ සංස්කරණය, කේත කිරීම, දත්ත පරිගනක ගත කිරීම සහ අවසන් වාර්තාව සකස් කිරීමේ කටයුතු අවසන් කර ඇත.

### 2.1.16 වාර්ෂික කර්මාන්ත සමික්ෂණය - 2015

වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය 2015 ට අදාලව ක්ෂේත්‍ර කටයුතු සිදු කිරීම සහ ක්ෂේත්‍රයෙන් ලද ප්‍රශ්නාවලී සංස්කරණය කිරීම, කේත කිරීම හා පරිගනක ගත කිරීමේ කටයුතු සම්පූර්ණ කර ඇති අතර අවසන් වාර්තාව සකස් කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.

වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය 2016 ට අදාලව ක්ෂේත්‍ර කටයුතු සිදු කර ක්ෂේත්රයෙන් ලද ප්‍රශ්නාවලී සංස්කරණය කිරීම, කේත කිරීම හා පරිගනක ගත කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.

### 2.1.17 වාර්ෂික වෙළඳ හා සේවා සමීක්ෂණය - 2016

2016 වර්ෂයේ මෙම සමීක්ෂණය සිදු කිරීම සඳහා ප්‍රශ්නාවලිය සැළසුම් කිරීම, සමීක්ෂණය පිළිබද ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීම පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ සමීක්ෂණයට අදාල ක්ෂේත්‍ර කටයුතු සිදු කිරීම සම්පූර්ණ කර ඇති අතර ක්ෂේත්‍රයෙන් ලද ප්‍රශ්නාවලි සංස්කරණය, කේත කිරීම හා පරිගනක ගත කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.

### 2.1.18 පරීක්ෂණාත්මක මිලදී ගැනීම් සමීක්ෂණය

දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන තවත් වැදගත් කාර්යයක් වන්නේ සෑම මාසයකම කොළඹ පාරිභෝගික මිල දර්ශකය ගණනය කර ප්‍රකාශයට පත්කිරීමය. මෙම දර්ශකාංකය ගණනය කිරීමට අවශ්‍ය මිල තොරතුරු ලබා ගැනීම සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශ ආවරණය වන පරිදි පරීක්ෂණාත්මක මිලදී ගැනීමේ සමීක්ෂණය සිදු කරනු ලැබේ. කොළඹ පාරිභෝගික මිල දර්ශකය ගණනය කිරීම සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික සීමාව තුල මධ්‍යස්ථාන 14 කින් භාණ්ඩ පැස සඳහා මිල ගණන් රැස් කිරීම සිදු කරනු ලැබේ. මෙහිදී තෝරාගත් භාණ්ඩ හා සේවාවන්හි මිල තොරතුරු අඛණ්ඩව තෝරාගත් වෙළඳසැල් වලින් එක් එක් භාණ්ඩය සඳහා සකසා ඇති පිරිවිතර තත්වයන්ට අනුකූලව එක්රැස් කරනු ලැබේ. ගෘහ ඒකකයන්ගේ නවතම වියදම් රටාව විදහා දැක්වීමට මෙම තොරතුරු භාවිතා

කරනු ලබන අතර මෙම පරීක්ෂණාත්මක මිලදී ගැනීමේ සමීක්ෂණයේ තොරතුරු මගින් කොළඹ පාරිභෝගික මිල දර්ශකය ගණනය කිරීම සහ ප්‍රකාශයට පත්කිරීම සිදුකරනු ලැබේ.

## 2.2 මෙරට සමාජ ආර්ථික දත්ත එක්රැස් කිරීම සහ සකස් කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව මගින් ඉටුකල අනෙකුත් සංඛ්‍යානමය කටයුතු

### 2.2.1 වී පිළිබඳ සංඛ්‍යාලේඛන

වී අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණයෙන් ලබා ගත් දත්ත විග්‍රහ කොට 2016 වසරේ මහ සහ යල කන්න සඳහා දිස්ත්‍රික් මට්ටමින් තොරතුරු ප්‍රකාශයට පත්කරන ලදී. එමෙන් ම, මහවැලි බල ප්‍රදේශවල කුඩා කළමනාකරණ කොට්ඨාශ මට්ටමින්ද, ඉහත දක්වන ලද සංඛ්‍යාතීන් පිළියෙල කර වෙබ් අඩවියේ ප්‍රකාශයට පත්කරන ලදී.

### 2.2.2 ප්‍රජාවිද්‍යා සංඛ්‍යාති

ජනගහන දත්ත පිළිබඳව පාර්ලිමේන්තුවට, රාජ්‍ය අංශයේ විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තුවලට,අර්ධ රාජ්‍ය ආයතන වලට, පුද්ගලික අංශයේ ආයතන වලට, පර්යේෂකයන්ට, සිසුන්ට හා විවිධ අවශ්‍යතා සඳහා දත්ත ඉල්ලීම් සඳහා තොරතුරු ලබාදීම නිතිපතා සිදු කරයි. එමෙන්ම, ජන හා නිවාස සංගණනය 2021 සඳහා සංගණන කාණ්ඩයක තරම (නාගරික, ග්‍රාමීය අංශයන් සඳහා) තීරණය කිරීම, සංශෝධන වලට ලක් කල යුතු සංගණන කාණ්ඩ 210ක් හඳුනා ගනු ලැබූ අතර ඒවායින් පූර්ව ලැයිස්තුගත කිරීමේ ලේඛන 78 ක් යාවත්කාලීන කිරීම සඳහා ක්ෂේත්‍රයට යවන ලදී. මීට අමතරව පැරිස් 21 වැඩ සටහනෙහි ආධාර ඇතිව “NSDS Country Training Programme” වැඩසටහන පැවැත්වීම, සංඛ්‍යාන සාක්ෂරතා වර්ධනය කිරීමේ වැඩසටහන් යටතේ මාධ්‍ය සහ ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 2 ක් පැවැත්වීම ද සිදු කරන ලදී.

### 2.2.3 ගොඩ ගොවිතැන් සංඛ්‍යාලේඛන

කන්න මට්ටමින් මූලික දත්ත වාර්තාකරුවන්ගේ සහාය ඇතිව එක්රැස් කරනු ලබන ගොඩ ඉඩම් වල බෝග වගාකරන බිම් ප්‍රමාණය, නිෂ්පාදනයට අදාලව වාර්ෂිකව රැස් කරනු ලබන සංඛ්‍යාතීන් ද සංරාංශගත කර රජයේ ප්‍රතිපත්ති සම්පාදකයින් හා අනෙකුත් ආයතනවලට දත්ත ලබාදීමට කටයුතු කළ අතර එම දත්ත වෙබ් අඩවියටද ඇතුලත් කරන ලදී.

මෙහිදී. ස්ථිර භෝග සහ කාලීන භෝග යටතේ සුළු අපනයන බෝග, පළතුරු, .එලවළු, ධාන්‍ය වර්ග හා රනිල භෝග ඇතුළුව භෝග වර්ග 60 ක් පමණ ආවරණය වන පරිදි වගා කරන ලද බිම් ප්‍රමාණය සහ අස්වැන්න 2015/2016 මහ කන්නය සඳහා ඇස්තමේන්තු කර ප්‍රකාශයට පත් කරනු ලැබීය.

### 2.2.4 සත්ත්ව සංඛ්‍යාති එක් රැස් කිරීම - 2016

2016 වර්ෂයේ දී සත්ත්ව සංඛ්‍යාති වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා සතුන් ඇති කරනු ලැබූ සියලුම නිවාස ඒකක , රජයේ හා පෞද්ගලික ගොවිපලවල් ආදියට ගොස් තොරතුරු රැස් කරන ලදී. මෙමගින් ඇති කරනු ලැබූ එළ හරක්, මී හරක්, එළුවන්, බැටළුවන්, ඌරන්, කුකුළන්, තාරාවන්, කළුකුන් හා වටුවන් ආදී සතුන් පිළිබද තොරතුරු හා සත්ව සංඛ්‍යාව ද එළ කිරි, මී කිරි හා බිත්තර නිෂ්පාදනය පිළිබඳ තොරතුරු ද ග්‍රාම නිලධාරි මට්ටමින් එක් රැස් කරන ලදී.

එක් රැස් කරනු ලැබූ එම තොරතුරු ප්‍රා. ලේ. මට්ටමින් හා දිස්ත්‍රික්ක මට්ටමින් පිළියෙල කොට, 2016 වර්ෂය සඳහා ඉහත සඳහන් එක් එක් සත්ත්ව ගහණය ද කිරි හා බිත්තර නිෂ්පාදනය පිළිබඳ ඇස්තමේන්තු ද පිළියෙල කිරීමට කටයුතු යොදන ලදී.

### 2.2.5 මස් පිණිස මරණ ලද සතුන්ගේ සංඛ්‍යාලේඛන

2016 වර්ෂයේ දී, 2015 වර්ෂය සඳහා පළාත් පාලන ආයතන මගින් මස් පිණිස සතුන් මැරීමට බලපත්‍ර ලබා දුන් ගව ඝාතකාගාර වලින් , මස් පිණිස මරණ ලද සතුන් පිළිබඳ සංඛ්‍යාලේඛන එක්රැස් කරන ලදී. එම තොරතුරු මගින් 2015 වර්ෂය සඳහා දිස්ත්‍රික් මට්ටමින් මස් පිණිස මරණ ලද සතුන්ගේ සංඛ්‍යාති පිළියෙල කරන ලදී.

### 2.2.6 ආහාර ශේෂ පත්‍රය

වාර්ෂිකව පිළයෙල කරනු ලබන ආහාර ශේෂ පත්‍රය මගින් ඒක පුද්ගල ආහාර සැපයුම පෙන්නුම් කරන අතර එමගින් රටේ පවතින පෝෂණ තත්ත්වය ජාතික මට්ටමින් පිළිබිඹු වේ. 2015 වර්ෂයේ කෘෂිකාර්මික නිෂ්පාදන සැලකිල්ලට ගෙන 2015 වර්ෂයේ ඒක පුද්ගල ආහාර සැපයුම පිළිබඳ ඇස්තමේන්තු පිලියෙල කරනු ඇත.

### 2.2.7 ජාතික ගිණුම්

ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් සකස් කිරීමේ නිල වගකීම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට පැවරී ඇති අතර කාර්තුමය හා වාර්ෂික ව ජාතික ගිණුම් සැකසීම සිදු කරනු ලබයි.

2016 වසර තුලදී 2010 පාද වර්ෂය ලෙස ගෙන සකසන ලද ජාතික ගිණුම් සංඛ්‍යාතීන් සහ අනෙකුත් කාර්යයන් පහත දැක්වේ.

1. දළ ජාතික නිෂ්පාදිතය ඇතුළු සියළුම සාර්ව ආර්ථික සංඛ්‍යාතීන් නිෂ්පාදන, ආදායම් සහ වියදම් ප්‍රවේශයන් යටතේ 2015 වර්ෂය සඳහාත් 2015 සිව්වැනි කාර්තුව සහ 2016 වර්ෂයේ පලවන, දෙවන සහ තෙවන කාර්තු සඳහාත් නිකුත් කිරීම සහ දෙපාර්තමේන්තු වෙබ් අඩවිය මගින් ප්‍රකාශයට පත් කිරීම.

2. 2015 වර්ෂය හා සිව්වන කාර්තුව සඳහා දත්ත නිකුත් කිරීමේදී ඒ සඳහා මාධ්‍ය දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීම.

3. ප්‍රකාශයට පත්කරන ලද ජාතික ගිණුම් දත්ත යාවත්කාලීන කිරීමේ සංශෝධිත ප්‍රතිපත්තිය අනුව නිවැරදි කරන ලද 2014 වාර්ෂික හා කාර්තුමය ජාතික ගිණුම් දත්ත සහ 2016 මුල් කාර්තු දෙකෙහි ජාතික ගිණුම් දත්ත ප්රකාශයට පත් කිරීම.

4. ජාතික ගිණුම් දත්ත වැඩි දියුණු කිරීම සඳහා දත්ත ලබා දෙන ආයතන වෙනුවෙන් කෘෂිකර්මාන්ත , කර්මාන්ත අංශ සඳහා වැඩමුළු 1 බැගින්ද සේවා අංශය සඳහා වැඩමුළු 3 ක්ද පැවැත්විණි.

5. ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරකම් මඟින් ලබා දෙන භාණ්ඩ සහ සේවාවන්හි නිමැවුම සහ එහි අතරමැදි සහ අවසන් පාරිභෝජනය, ආනයන සහ අපනයන සහ දළ ප්‍රාග්ධන සම්පාදනය යනාදී කරුණු රාශියක් පිළිබඳ විස්තරාත්මක තොරතුරු සපයන 'සැපයුම් සහ භාවිතා' වගුව 2010 වර්ෂය පාදක කොටගෙන තවදුරටත් යාවත්කාලීන කල අතර ඒ අනුව 2010 වර්ෂය සඳහා ආදාන - ප්‍රතිදාන වගුව සකස් කිරීම. 2010 වර්ෂය සඳහා සකස් කරන ලද සැපයුම් සහ භාවිතා වගුව, ආදාන - ප්‍රතිදාන වගුව සහ ඊට අදාළ ආධාරක වගු දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා ප්‍රකාශයට පත් කිරීම.

6. සාර්ක් රටවල් නියෝජනය කරමින් ඉන්දියාවේදි පවතී සාර්ක් සමුළුව සඳහා අවශ්‍ය දත්ත ලබා දීම සහ සාර්ක් රටවල ජාතික ගිණුම් තොරතුරු ඇතුලත් වාර්තාවක් සකස් කිරීම. ඊට අමතරව වෙනත් දේශීය සහ විදේශීය ආයතන සඳහා අවශ්‍ය දත්ත විශ්ලේෂණය කර සකස් කිරීම හා ලබා දීම.

7. 2010 පාද වර්ෂයට අනුව 2015 වර්ෂයේ ජාතික ගිණුම් වාර්ෂික වාර්තාව සකස් කිරීම.

**වගුව 2 : වාර්ෂික ජාතික ගිණුම් ඇස්තමේන්තුවල ප්‍රධාන දර්ශක 2013-2016 (2010 පාද වර්ෂය යටතේ)**

| දර්ශකය | 2013 | 2014* | 2015* | 2016** |
|---|---|---|---|---|
| දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය(%) | 3.4 | 5.0 | 4.8 | 4.4 |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (රුපියල්) | 466,112 | 498,828 | 522,355 | 558,363 |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (ඇමෙරිකානු ඩොලර්) | 3,610 | 3,821 | 3,844 | 3,835 |
| ඒක පුද්ගල දළ ජාතික ආදායම (රුපියල්) | 455,126 | 487,462 | 508,936 | 542,669 |
| ඒක පුද්ගල දළ ජාතික ආදායම (ඇමෙරිකානු ඩොලර්) | 3,525 | 3,734 | 3,745 | 3,727 |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (ඇමෙරිකානු ඩොලර්) වර්ධනය (%) | 7.7 | 5.8 | 0.6 | -0.2 |
| ඒක පුද්ගල දළ ජාතික ආදායම (ඇමෙරිකානු ඩොලර්) වර්ධනය (%) | 7.1 | 5.9 | 0.3 | -0.5 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකය (2002=100) | 122 | 126 | 127 | 131 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකය අනුව උද්ධමනය (%) | 6.2 | 2.9 | 0.8 | 3.6 |

* සංශෝධිත, ** යාවකාලිකයි

**වගුව 3 : කාර්තුගත ජාතික ගිණුම් ඇස්තමේන්තුවල ප්‍රධාන දර්ශක, 2014 කාර්තු 1 සිට2016 කාර්තු 4 දක්වා (2010 පාද වර්ෂය යටතේ)**

| දර්ශකය | 2014* | | | | 2015* | | | | 2016** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | කාර්තු | | | | කාර්තු | | | | කාර්තු | | | |
| | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය (%) | 1.3 | 2.2 | 5.1 | 10.6 | 4.6 | 7.0 | 5.3 | 2.9 | 5.1 | 2.4 | 4.6 | 5.3 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකය (2002=100) | 132.3 | 128.0 | 126.8 | 117.8 | 135.2 | 128.8 | 127.5 | 117.7 | 139.1 | 134.8 | 128.9 | 124.4 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය මිල දර්ශකය අනුව උද්ධමනය (%) | 2.7 | 4.2 | 2.8 | 2.5 | 2.2 | 0.6 | 0.5 | -0.1 | 2.9 | 4.6 | 1.1 | 5.7 |

* සංශෝධිත, ** යාවකාලිකයි

### 2.2.8 ජාතික පාරිභෝගික මිල දර්ශකය (NCPI) (පදනම 2013 = 100)

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන නවතම පාරිභෝගික මිල දර්ශකය වන ජාතික පාරිභෝගික මිල දර්ශකය 2015 ඔක්තෝම්බර් මස සිට අදාල ලිත් මාසය අවසන් වී දින 21 පසු ප්‍රකාශයට පත් කරනු ලැබේ. ජාතික පරිභෝගික මිල දර්ශකයේ බර තැබීම 2012/13 වර්ෂයේ පාරිභෝගිකයන්ගේ වියදම් රටාව පිළිබිඹු වන ආකාරයට ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයන්ට අනුව සකස් කර ඇත. ජාත්‍යන්තර සම්මත ක්‍රමවේදයන්ට අනුව නව පාරිභෝගික මිල දර්ශකය එනම් ජාතික පාරිභෝගික මිල දර්ශකය සකස් කිරීමේදී ශ්‍රී ලංකාවේ පළාත් නවයම ආවරණය වන පරිදි මිල ගණන් රැස් කෙරේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මහ කොළඹ නාගරික ප්‍රදේශය සඳහා පමණක් සීමා වන මිල දර්ශකයක් 1953 පටන් 2008 අප්‍රේල් මාසය දක්වා ගණනය කර ප්‍රකාශයට පත් කර ඇති අතර කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශ සඳහා පමණක් සීමාවන මිල දර්ශකයක් 2008 මැයි මාසයේ සිට මේ දක්වා ගණනය කර ප්‍රකාශයට පත් කෙරේ. කෙසේ වෙතත් මුළු රටම ආවරණය වන පරිදි මිල වෙනස්වීම් ගණනය කිරීම සඳහා වන දර්ශකයක අවශ්‍යතාව ඒ වන විට මතු විය. ජාතික පාරිභෝගික මිල දර්ශකය ගණනය කිරීම සඳහා දිවයිනේ සියළුම කුටුම්භයන්ගේ පරිභෝජන රටාව හඳුනා ගැනීම 2012/13 වසරේ පැවති ගෘහ ඒකක ආදායම හා වියදම් සමීක්ෂණ මගින් සිදු කරනු ලදී. සෑම ගෘහ කාණ්ඩයක්ම සිදු කරනු ලබන සියළුම ආකාරයේ වියදම් අන්තර්ගත වන අතර එම තොරතුරු මගින් රටේ සෑම ගෘහ කාණ්ඩයක්ම නියෝජනය වේ. ජාතික පාරිභෝගික මිල දර්ශකයේ පදනම් වර්ෂය ලෙස 2013 වර්ෂය සලකා ඇත.

ජාතික පාරිභෝගික මිල දර්ශකය සඳහා සෑම දිස්ත්‍රික්කයකම ප්‍රධාන නගරයේ මිල රැස් කරන මධ්‍යස්ථාන 3 කින් භාණ්ඩ පැස සඳහා මිල ගණන් රැස් කරනු ලැබේ. ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013=100) ශ්‍රී ලංකාවේ උද්ධමනය මැනීමේ නිල මිණුම ලෙස 2015 ඔක්තෝම්බර් මාසයේ සිට භාවිතා කරනු ලැබේ. ඒ අනුව 2015 වසරේ සහ 2016 වසරේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය පහත වගුව මගින් දැක්වේ.

**වගු අංක 4: ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම 2013=100)**

| මාසය | දර්ශක අගය | |
|---|---|---|
| | **2015** | **2016** |
| ජනවාරි | 112.8 | 112.0 |
| පෙබරවාරි | 108.9 | 110.8 |
| මාර්තු | 107.6 | 110.0 |
| අප්‍රේල් | 107.0 | 111.6 |
| මැයි | 108.0 | 113.7 |
| ජූනි | 109.1 | 116.1 |
| ජූලි | 108.9 | 115.2 |
| අගෝස්තු | 108.4 | 113.3 |
| සැප්තැම්බර් | 108.4 | 113.5 |
| ඔක්තෝම්බර් | 109.2 | 114.7 |
| නොවැම්බර් | 112.0 | 116.6 |
| දෙසැම්බර් | 113.2 | 118.0 |

### 2.2.9 දිස්ත්‍රික් නාගරික සිල්ලර සහ නිෂ්පාදකයාගේ මිල ගණන් රැස් කිරීම

දෙපාර්තමේන්තුව මගින් ඉටු කරනු ලබන තවත් කාර්යයක් වන්නේ දිස්ත්‍රික් නාගරික සිල්ලර මිල ගණන් හා නිෂ්පාදකයාගේ මිල ගණන් රැස් කිරීමයි. එම කාර්යය වැඩි දියුණු කිරීම සඳහා, දිස්ත්‍රික් නාගරික සිල්ලර මිල ගණන් රැස් කිරීමේ පෝරම පලාත් මට්ටමින් සංශෝධනය කරන ලදී. සියළුම දිස්ත්‍රික්ක වල ප්‍රධාන නගරයන්හි ආහාර හා විවිධ පාරිභෝගික භාණ්ඩ පිළිබඳ සිල්ලර මිල ගණන් සතිපතා, සති දෙකකට වරක්, මාසිකව හා කාර්තුමය පදනමක් මත එක් රැස් කරනු ලබන අතර දේශීයව නිෂ්පාදනය කෙරෙන කෘෂිකාර්මික , සත්ත්ව හා ධීවර නිෂ්පාදන ද්‍රව්‍ය සඳහා නිෂ්පාදකයාගේ මිල ගණන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රමවත්ව, මාසිකව දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර සංඛ්‍යාන කාර්ය මණ්ඩලය යොදා ගැනීමෙන් එක් රැස් කරවා මිල හා වේතන අංශය වෙත ගෙන්වා ගනු ලැබේ.

මිල තොරතුරු ඇතුලත් කර 2015 ජනවාරි සිට 2015 දෙසැම්බර් දක්වා සතිපතා සිල්ලර මිල ගණන් (කොළඹ දිස්ත්‍රික්කය) හි මිල විවරණිකාවේ 24 වන නිකුතුව මුද්‍රණය කර ප්‍රකාශනයට පත් කරන ලදී. 2012-2015 දක්වා දිස්ත්‍රික් නාගරික සිල්ලර මිල සහ නිෂ්පාදකයාගේ මිල ගණන් ඇතුළත් විවරණිකාවේ 33 වැනි නිකුතුවද මුද්‍රණය කර ප්‍රකාශනයට පත් කරන ලදී.

තවද, මෙම සිල්ලර මිල තොරතුරු සහ නිෂ්පාදකයාගේ මිල තොරතුරු ජාතික ගිණුම් ගණනය කිරීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ජාතික ගිණුම් අංශයට කාර්තුමය වශයෙන් ලබා දෙනු ලැබේ. මෙයට අමතරව දත්ත භාවිතා කරන්නන්ගේ අවශ්‍යතාවයන් සඳහාද මෙම තොරතුරු ලබා දීමට කටයුතු සලසා ඇත. ආහාර ද්‍රව්‍ය, විවෘත වෙළඳ පොළ සිල්ලර මිල තොරතුරු ජනාධිපති ලේකම් කාර්යාලය, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අදාළ නිළධාරින් වෙත සතිපතා ඉදිරිපත් කරනු ලැබේ. මෙම මිල ගණන් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේද ප්‍රකාශයට පත් කරනු ලැබේ. 2016 වර්ෂය සඳහා යුධ හමුදා නිළධාරින්ගේ සහ අනෙකුත් තරාතිරම්වල පුද්ගලයන්ගේ සලාක වටිනාකම ගණනය කර යුධ හමුදාපති වෙත ඉදිරිපත් කිරීම සිදු කරන ලදී.

### 2.2.10 නිෂ්පාදකයාගේ මිල දර්ශකය (PPI) : (පදනම 2013 Q4=100)

රටක ජාතික සංඛ්‍යාලේඛන වැඩසටහනට ඇතුලත් වන මුලික විෂයයක් ලෙස නිෂ්පාදකයාගේ මිල දර්ශකය හැදින්විය හැකි අතර දේශීය නිෂ්පාදකයා තම නිපැයුම් වලට ලබාගන්නා මිලේ සිදුවන වෙනස් වීම මෙමගින් මනිනු ලැබේ. ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් ගණනය කිරීම සඳහා මෙන්ම එහි ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සඳහාද මෙම මිල දර්ශකය ඉතා අවශ්‍ය මෙවලමකි. එමෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුව වැනි ආයතන හා රටේ නීති සම්පාදකයින් මෙන්ම ප්‍රතිපත්ති සැලැසුම් කරන්නන්ද මෙම දර්ශකාංකය භාවිතා කරනු ලබයි.

දේශීයව නිෂ්පාදනය කෙරෙන කෘෂිකාර්මික, සත්ත්ව හා ධීවර නිෂ්පාදන ද්‍රව්‍ය වල මිල ගණන් ප්‍රාදේශිය කොට්ඨාශ මට්ටමින් අප දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලය විසින් මාසිකව එකතු කරනු ලබන අතර එක් අයිතමයක් සඳහා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ මධ්‍යස්ථාන 03 කින් මිල තොරතුරු රැස් කරනු ලැබේ. නිෂ්පාදන කර්මාන්ත හා උපයෝගිතා කර්මාන්ත (විදුලිය හා ජලය සැපයීම) යන අංශ වල මාසික මිල තොරතුරු කාර්තුමය වශයෙන් එකතු කරනු ලැබේ. බස්නාහිර, දකුණ, මධ්‍යම යන පළාත් හි පිහිටා තිබෙන නිෂ්පාදන කර්මාන්ත අංශයට අයත් ආයතන 375 කින් මිල තොරතුරු එක්රැස් කරනු ලැබේ. නිෂ්පාදකයාගේ මිල දර්ශකයේ පදනම 2013 හතරවන කාර්තුව වේ. ප්‍රථම වතාවට නිෂ්පාදකයාගේ මිල දර්ශකය 2015 දෙවන කාර්තුව සඳහා ප්‍රකාශයට පත් කරන ලදී. නිෂ්පාදකයාගේ මිල දර්ශකය විචලනය 2015 හා 2016, පලමු කාර්තුවේ සිට තෙවන කාර්තුව දක්වා පහත වගුවේ දැක්වේ.

**වගු අංක 5: නිෂ්පාදකයාගේ මිල දර්ශකයේ විචලනය (පදනම 2013** Q4=100)

| මාසය | දර්ශක අගය | |
|---|---|---|
| | **2015** | **2016** |
| ජනවාරි | 107.3 | 103.7 |
| පෙබරවාරි | 103.2 | 105.8 |
| මාර්තු | 101.9 | 101.4 |
| අප්‍රේල් | 102.9 | 102.6 |
| මැයි | 105.8 | 104.8 |
| ජුනි | 105.5 | 107.0 |
| ජුලි | 107.2 | 107.8 |
| අගෝස්තු | 105.3 | 106.0 |
| සැප්තැම්බර් | 105.8 | 107.0 |
| ඔක්තෝම්බර් | 104.7 | 109.9 |
| නොවැම්බර් | 106.3 | 113.4 |
| දෙසැම්බර් | 107.2 | 115.3 |

### 2.2.11 ජාත්‍යන්තර සංසංදනාත්මක වැඩසටහන (ICP)

ආසියානු සංවර්ධන බැංකුව මඟින් මෙහෙයවනු ලබන ආසියා-පැසිපික් කලාපයේ ජාත්‍යන්තර සංසන්දනාත්මක වැඩසටහන යටතේ අයිතමයන් 297 ආවරණය වන පරිදි සතිපතා (අයිතම - 42) මාසිකව (අයිතම - 71) කාර්තු වශයෙන් (අයිතම -114) සහ වසරකට දෙවරක් (අයිතම - 70) කොළඹ දිස්ත්‍රික්කයේ, පිටකොටුව, ග්‍රෑන්පාස්, වැල්ලවත්ත, නාරාහේන්පිට, කඩුවෙල සහ හෝමාගම යන නගර වලින් මිල තොරතුරු එක් රැස් කරන ලදී. 2016 වසර සඳහා එකතු කරන ලද මිල තොරතුරු පරීක්ෂාකර, පරිගණකගත කොට ආසියානු සංවර්ධන බැංකුව වෙත යවා ඇත.

### 2.2.12 පළාත් පාලන සංඛ්‍යාති

දිවයිනේ සියලුම මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා ඇතුලත් පළාත් පාලන ආයතනයන්හි ආදායම් වියදම් දත්ත සහ එමඟින් සපයන සේවාවන්, යටිතල පහසුකම් ඇතුලු පොදු තොරතුරු රැස්කිරීම සෑම වර්ෂයකදීම සිදු කරනු ලබයි. දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ හරහා පළාත් පාලන ආයතන මගින් ලබාගන්නා තොරතුරු විශ්ලේෂණය කර ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය කාර්තුගතව ගණනය කිරීම සඳහා ජාතික ගිණුම් අංශයට ලබා දෙන අතර වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන සංඛ්‍යාන නිබන්ධනය සහ සංඛ්‍යාන අත්පොතෙහි ද 2015 වර්ෂයට අදාළ පළාත් පාලන සංඛ්‍යාතීන් ඇතුලත් කර ඇත.

### 2.2.13 පර්යේෂණ හා විශේෂ අධ්‍යයන කටයුතු

**I. නිල සංඛ්‍යාති වැඩසටහන**

නිල සංඛ්‍යාති වැඩසටහන මගින් රටේ විවිධ ආයතන සතු දත්ත උපයෝගීකරගෙන සකස් කළ හැකි දර්ශකාංක හඳුනාගෙන එම දර්ශකාංක දත්ත පරිහරණය කරන්නන් වෙත විධිමත්ව ලබාදීම සඳහා අවශ්‍ය වැඩපිළිවෙලක් සකස් කිරීම සිදු කරයි. මෙම වැඩසටහන ජාතික දත්ත කමිටුවට අනුබද්ධ අනුකමිටු 23ක් හරහා සිදු කරනු ලබන අතර මෙහිදී එක් එක් විෂයයන්ට අදාල ප්‍රධාන ආයතන හඳුනාගෙන එම ආයතන වල නියෝජිතයන්ගෙන් සැදුම්ලත් අනුකමිටු පිහිටුවා එම අනුකමිටු මගින් ක්ෂේත්‍රයට අදාල දර්ශකාංක හඳුනාගෙන එම දර්ශකාංක සකස් කිරීමේ ක්‍රමවේදය, නිකුත් කරනු ලබන කාල පරාසය යනාදිය ඇතුලත් සම්පූර්ණ වාර්තාවක් සකස් කළ යුතු වේ. 2016 වර්ෂය අවසන් වන විට මෙම අනුකමිටු අතරින් 22ක වැඩ සම්පූර්ණයෙන් නිම කර අවසන් වාර්තාව භාරදී ඇත. ඉතිරි අනුකමිටු වල කාර්යයන් තව දුරටත් සිදුකරමින් පවතී.

**II. ස්ත්‍රී පුරුෂ භාවය අනුව සංඛ්‍යාති සකස් කිරීම (Preparing Gender Statistics)**

දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන සංගණන හා සමීක්ෂණ තොරතුරු සහ අනෙකුත් මූලාශ්‍රවලින් ලබාගන්නා ලද දත්ත භාවිතයෙන් ස්ත්‍රී පුරුෂ භාවය අනුව සංඛ්‍යාති සකස් කර එම සංඛ්‍යාති ඉදිරිපත් කිරීම සඳහා වෙබ් පිටුවක් සකස් කරන ලදී.

**III. ජාතික තොරතුරු කමිටුවට අදාල රාජකාරී කටයුතු**

ශ්‍රී ලංකාවේ දත්ත සපයනු ලබන ප්‍රධාන ආයතන තුනක් වන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, මහා භාණ්ඩාගාරය හා ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණායතනය සම්බන්ධ කර ගනිමින් කලට වේලාවට විශ්වාසනීය ආකාරයට දත්ත නිකුත් කිරීම තහවුරු කිරීම, දත්ත වල ද්විකරණය (duplication) වැලැක්වීම හා සියළු දෙනා සඳහා දත්ත විවෘත කිරීම පදනම් කර ගනිමින් 2015 වර්ෂයේදී ජාතික තොරතුරු කමිටුව ස්ථාපනය කරන ලදී. තොරතුරු කමිටු රැස්වීම් වලට සහභාගී වෙමින් මෙම කමිටුවේ කාර්යයන් සඳහා සහයෝගය ලබාදීම දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

**IV. සාර්ක් සංඛ්‍යාති සකස් කිරීම**

සාර්ක් සංවිධානයට අයත් රටවල් වල සංඛ්‍යාලේඛන ආයතන විසින් වාර්ෂිකව සාර්ක් මහලේකම් කාර්යාලය වෙත යැවිය යුතු SAARC in Figures, SAARC Statistical Year Book ප්‍රකාශන වල ශ්‍රී ලංකාවට අදාල සංඛ්‍යාති/දර්ශකාංක යාවත්කාලීන කර යවන ලදී. මීට අමතරව SAARC Expert Group, SAARC Catalogue of Publications, SAARC Manual, Statistical Systems යන වාර්තා ද සාර්ක් මහලේකම් කාර්යාලය වෙත යවන ලද අතර සාර්ක් කලාපීය සංඛ්‍යාලේඛන ආයතන ප්‍රධානීන්ගේ වාර්ෂික රැස්වීම් වලදී එකඟව ඇති පරිදි ශ්‍රී ලංකාවට අදාළ සියලු ලිපි ලේඛන ඉදිරිපත් කිරීම සම්බන්ධීකරණය කරන ලදී.

**V. අන්තර් ජාතික ඉල්ලීම් සඳහා පිළිතුරු සැපයීම**

එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් ආයතන සහ අනෙකුත් ජාත්‍යන්තර සහ කලාපීය සංවිධාන මගින් එවනු ලබන ප්‍රශ්ණාවලි සඳහා පිළිතුරු සැපයීම මෙන්ම ජාත්‍යන්තර ආයතන වල දත්ත ඉල්ලීම් අනුව දෙපාර්තුමේන්තුව විසින් පිළියෙළ කරනු ලබන දත්ත මෙන්ම වෙනත් ආයතන වලින් ලබාගත යුතු දත්ත එම ආයතන වෙත ලබාදීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කෙරිණි. එමෙන්ම ජාත්යන්තර සංවිධාන/ආයතන මගින් සංඛ්‍යාලේඛන ක්ෂේත්‍රයට අදාල විවිධ ප්‍රකාශන සඳහා අදහස් විමසීම්, අර්ථ නිරූපන ඉල්ලීම් කරනු ලබන අවස්ථාවලදී අදාල දේශීය ආයතන සම්බන්ධීකරණය කරමින් එම අවශ්‍යතා ඉටු කිරීම ද දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂයේදී ද අඛණ්ඩව සිදු කරනලදී.

**VI. පර්යේෂණ හා විශේෂ අධ්‍යයන කටයුතු**

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පර්යේෂණ කටයුතු වලට යොමු කිරීම හා ඒ තුළින් දෙපාර්තමේන්තුව තුළ පර්යේෂණ කටයුතු ප්‍රචලිත කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ. දෙපාර්තමේන්තුව තුළ පර්යේෂණ කටයුතු සිදු කිරීමට කැමැත්තක් දක්වන විධායක නිලධාරීන් ගෙන් මූලික පර්යේෂණ යොජනාවලි ගෙන්වා ගන්නා ලද අතර එම නිලධාරීන්ට විධිමත් පර්යේෂණ යොජනාවලියක් සකස් කරන ආකාරය පිළිබඳව සහ පර්යේෂණ ක්‍රමවේද පිළබඳව පුහුණු අවස්ථා ලබා දීමට සැලසුම් කරන ලදී.

**VII. දර්ශනපති උපාධි සඳහා ශිෂ්‍යත්ව ලබාදීමේ වැඩසටහන**

දෙපාර්තමේන්තුව මගින් ඉටු කෙරෙන කාර්යයන් වඩාත් සාර්ථකව සිදු කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරීන් දේශීය විශ්ව විද්‍යාල මගින් පවත්වනු ලබන ආචාර්ය උපාධි පාඨමාලා හැදෑරීම සඳහා උනන්දු කරවීමේ අරමුණින් මෙම වැඩසටහන හඳුන්වා දෙන ලද අතර දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරීන් අනුයුක්ත අංශ සහ ආයතන වෙත වැඩසටහන පිළිබඳ විස්තර සහ අයදුම්පත් යවා කැමති නිලධාරීන් විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත් ගෙන්වාගෙන ඇති අතර එම අයදුම්පත් ඉදිරි කටයුතු සඳහා යොමු කර ඇත.

**VIII. ඉදිරි දත්ත මුදාහැරීමේ දින සටහන**

වර්ෂය ආරම්භයේදී 2016 වර්ෂය සඳහා ඉදිරි දත්ත මුදාහැරීමේ දින සටහන සකස් කර දෙපාර්තමේන්තු වෙබ් අඩවියට ඇතුළත් කරන ලද අතර එතැන් සිට එහි යාවත්කාලීන කිරීම සිදු කිරීම අඛණ්ඩව වර්ෂය පුරා සිදු කරන ලදී.

## 2.2.14 ව්‍යාපාර පිළිබඳ සංඛ්‍යාන නාමාවලිය( Statistical Business Register)

ව්‍යාපාර පිළිබද සංඛ්‍යාන නාමාවලිය(SBR) සකස් කිරීම සඳහා අවශ්‍ය වන ආයතන පිළිබඳ තොරතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් ලබා ගෙන ඇති අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ,සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලය, සංචාරක මණ්ඩලය යන ආයතන වල දත්ත පද්ධති සමග SBR ව්යාපෘතිය යටතේ

අන්තර් ජාල සබඳතාවක් (Link) ගොඩනගා ඇත. එලෙසින් ම ආසියානු සංවර්ධන බැංකු නියෝජිතයින් හා SBR ව්‍යාපෘතියට සම්බන්ධ අනෙකුත් ආයතන වල සාමාජිකයින් ගේ සහභාගිත්වයෙන් වැඩමුළුවක් පවත්වනු ලැබූ අතර ආයතන රාමුව තුළ පවතින ද්විගණනය සහිත ආයතන ඉවත් කිරීම හා ආයතන රාමුව නිවරදි කිරීම ද සිදු කරන ලදී.

### 2.2.15 ගොඩනැගිලි සංඛ්‍යාලේඛන

ශ්‍රී ලංකාවේ මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා යන සෑම පලාත් පාලන බල ප්‍රදේශයක්ම ආවරණය වන පරිදි මාසිකව ගොඩනැගිලි සංඛ්‍යාලේඛන එක් රැස් කරනු ලැබේ. මෙම සංඛ්‍යාලේඛණ රැස් කරනු ලබන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට අනුයුක්ත සංඛ්‍යාලේඛණ නිලධාරී හෝ සංඛ්‍යාලේඛණ සහකාර නිලධාරීන් විසිනි. BS/U/NEW නමින් හැඳින්වෙන මෙම පෝරමය මගින් ඒ ඒ මාසයට අදාලව අනුකූලතා සහතික නිකුත් කිරීම සම්බන්ධ තොරතුරු ලබා ගන්නා ලදී. ඒ යටතේ සාදා නිම කරන ලද නව ගොඩනැගිලි, අතිරේක කොටස් ගැනීම් හා වෙනස්කිරීම්හි නේවාසික හා නේවාසික නොවන ගොඩනැගිලි වල මහල් සංඛ්‍යාව බිම් ප්‍රමාණය හා ඇස්තමේන්තු වියදම් ලබා ගන්නා ලදී. තවද එම ගොඩනැගිලි වල ගෙබිම, බිත්ති හා වහල තනන ලද්දේ කෙබඳු ද්‍රව්‍යවලින්ද යන්නද වාර්තා ලබා ගන්නා ලදී. II වන කොටස මගින් ඒ ඒ මාසය තුල නිකුත් කරන ලද ගොඩනැගිලි බලපත්‍ර ගණන හා ඒ යටතේ වූ වර්ග ප්‍රමාණය පිළිබඳ තොරතුරුද ලබා ගන්නා ලදී.

මාසිකව එක්රැස් කරනු ලබන ගොඩනැගිලි සංඛ්‍යාලේඛන වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා සෑම මසකදීම දිස්ත්‍රික් සංඛ්‍යාලේඛනඥ මගින් එක් පළාත් පාලන ආයතනයක තොරතුරු රැස් කිරීම අධීක්ෂණය කිරීම සිදු කරනු ලබයි.

ගොඩනැගිලි සංඛ්‍යාලේඛන රැස් කිරීමේ නව ආකෘති පත්‍රය වන BS/U/NEW මගින් 2015 ජූලි මාසයේ සිට දත්ත රැස් කිරීම ක්ෂේත්‍රයේදී සිදු කරමින් පවතී.මෙතෙක් ලබා ගන්නා තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් සෑම වර්ෂයකදීම සංඛ්‍යාන නිබන්ධනය සඳහා අදාලවූ ගොඩනැගිලි සංඛ්‍යාතීන් ලබා දෙනු ලැබේ.

### 2.2.16 කාර්මික නිෂ්පාදන දර්ශකය (IIP)

මෙම දර්ශකය ගණනය කිරීම සඳහා මෙරට කාර්මික අංශයේ නිෂ්පාදන වලට ඉහළ දායකත්වයක් ලබා දෙන කාර්මික භාණ්ඩ ආවරණය කරනු ලැබේ. ඒ තුලින් රටේ කාර්මික අංශයේ අභිවෘද්ධිය නිරූපනය කිරීම හා කාර්මික අංශයේ කෙටිකාලීන ආර්ථික ප්‍රවනතා හා හැසිරීම හඳුනා ගැනීම සිදු කරනු ලබයි. 2016 වර්ෂයේ පළමු, දෙවන හා තෙවන කාර්තු සඳහා ක්ෂේත්‍ර කටයුතු සිදුකිරීම සහ 2016 වර්ෂයේ පළමු, දෙවන හා තෙවන කාර්තු සහ ඔක්තෝම්බර් මාසය සඳහා නිෂ්පාදන දර්ශකය ගණනය කිරීම හා වාර්තාව ප්‍රකාශයට පත් කිරීම සපුරා ඇත.

### 2.2.17 පුහුණු කටයුතු

සංඛ්‍යාන පුහුණු අංශය මගින් 2016 වර්ෂය සඳහා පහත සඳහන් පුහුණු පාඨමාලා පවත්වා ඇත.

| පාඨමාලාවේ නම | පුහුණු වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| 1. දෙමළ භාෂා පුහුණුව (III මට්ටම) | 117 |
| 2. සිංහල භාෂා පුහුණුව | 13 |
| 3. ඉංග්‍රීසි භාෂා පුහුණුව | 35 |
| 4. විදේශ පාඨමාලාවකට සහභාගි වීමෙන් පසු පුහුණු සැසි පැවැත්වීම | 16 |
| 5. මූලික පරිගණක පුහුණු පාඨමාලාව | 41 |
| 6. කාර්යාල සේවක සේවය නිලධාරීන් සඳහා පුහුණු පාඨමාලාව | 19 |

| | |
|---|---|
| 7. දර්ශකාංක පිළබඳ පුහුණු පාඨමාලාව | 10 |
| 8. මූලික සංඛ්‍යාන පිළිබඳ පුහුණු පාඨමාලාව | 18 |
| 9. SPSS පුහුණු පාඨමාලාව | 15 |
| 10. පරිගණක පුහුණු පාඨමාලාව (දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශයන්හි ICT නිලධාරීන් සඳහා) | 57 |
| 11. සංවර්ධන නිලධාරීන් දිරි ගැන්වීමේ වැඩමුළුව | 40 |
| 12. විගණන විමසුම සඳහා පිළිතුරු සකස් කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන | 34 |
| 13. පේරාදෙනිය විශ්ව විද්‍යාලයීය කෘෂිකාර්මික පශ්චාත් උපාධි ආයතයේ සිසුන් සඳහා පුහුණු පාඨමාලාව | 16 |
| 14. තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහකාර නිලධාරීන්ගේ කළමණාකරණය පිළිබඳ පාඨමාලාව | 28 |
| 15. මූලික සංඛ්‍යානය පිළිබඳ පාඨමාලාව (Module පුහුණුව) | 18 |
| 16. විශ්ව විද්‍යාලයීය විද්‍යාර්ථයින් දෙපාර්තමේන්තුව පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන | 80 |
| 17. නවක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි පුහුණුව | 10 |
| 18. ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා වූ දත්ත රැස් කිරීමේ කුසලතා සංවර්ධන වැඩසටහන | 15 |
| 19. වාර්තා ලිවීම පිළිබඳ පුහුණු පාඨමාලාව | 13 |
| 20. Presentation for Content Management Solution Process Automation | 24 |
| 21. GIS Application Open Source (Module Training) | 26 |
| 22. නව සංඛ්‍යාලේඛනඥයින් සඳහා දෙපාර්තමේන්තු කටයුතු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 58 |
| 23. මූලික පරිගණක පුහුණු පාඨමාලාව | 16 |
| 24. නියැදි සමීක්ෂණ ක්‍රමවේදය හා ඇස්තමේන්තු සකස් කිරීම පිළිබඳ පුහුණු පාඨමාලාව | 24 |
| 25. දෙපාර්තමේන්තුවේ පරිගණක ජාලය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන | 27 |
| 26. ක්ෂේත්‍රයේ දත්ත රැස්කිරීමේ අභියෝග පිළිබඳ පුහුණුව(Module Training) | 27 |
| 27. Master Trainers – Group 1 | 40 |
| 28. Master Trainers – Group 2 | 47 |
| 29. බාහිර ආයතන වලට අනුයුක්ත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට පුහුණුව | 67 |
| 30. තොරතුරු තාක්ෂණ කුසලතා සංවර්ධන වැඩසටහන | 29 |
| 31. දෙපාර්තමේන්තු පරිගණක ජාල ප්‍රතිව්‍යුහගත කිරීමේදී ඇති වූ ගැටළු නිරාකරණය කිරීම | 30 |
| 32. CsPro පරිගණක පුහුණු පාඨමාලාව | 26 |

### 2.2.18 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කටයුතු

දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන සංගණන හා සමීක්ෂණවල දත්ත සැකසුම් කටයුතු ද ඇතැම් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවලට අනුයුක්ත සංඛ්‍යාලේඛන අංශ වලට අයත් දත්ත සැකසුම් කටයුතුද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය මගින් සිදු කරන ලදී.

**I. ශ්‍රම බල සමීක්ෂණය - 2015/16**

උක්ත සමීක්ෂණයට අදාලව දත්ත ගොනුව සකස් කිරීම අවසන් කොට ඇත.

**II. ශ්‍රී ලංකා රේගු දත්ත**

2015 ඔක්තෝබර් සිට 2016 සැප්තැම්බර් දක්වා මාස වල දත්ත ගොනු සැකසීම සහ ආදායම් සංඛ්‍යාතීන් සැකසීම අවසන් කර ඇත.

**III. කම්කරු රැකියා සමීක්ෂණය - 2016**
**(Annual Employment Survey)**

කම්කරු දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන අංශය මගින් වාර්ෂිකව සිදු කරනු ලබන උක්ත සමීක්ෂණයේ දත්ත ගොනුව පිලියෙල කිරීම අවසන් කොට ඇත.

**IV. ආර්ථික සංගණනය - 2013/14**
**(කර්මාන්ත හා කෘෂිකර්ම අංශ)**

දත්ත ගොනු සැකසීම සහ වගු ආකෘතීන් ට අදාල පරිගණක වැඩසටහන් නිම කර ඇත.

**V. දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වැඩි දියුණු කිරීම**

2016 වර්ෂයට සැලසුම් කල දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වැඩි දියුණු කිරීමේ කටයුතු හා යාවත්කාලීන කිරීමේ කටයුතු අවසන් කරන ලදී.

**VI. කඩිනම් දත්ත වැඩ සටහන (Accelerated Data Programme ) (ADP)**

ස්ථාපනය කරන ලද දත්ත පද්ධතිය වැඩි දියුණු කිරීමේ සහ යාවත්කාලීන කිරීමේ කටයුතු සැලසුම් මෙම වසර තුලදී ඉටු කරන ලදී.

**VII. Digital Display Unit**

දත්ත ප්‍රදර්ශනය කිරීමේ ඒකකයට අදාල නවතම දත්ත ඇතුලත් කරමින් යාවත්කාලීන කිරීමේ කටයුතු සිදු කර ඇත.

**VIII. ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණය (DHS) 2016**

දත්ත ගොනු සැකසීම සිදු කරමින් පවතී.

**IX. "ලංකා සිස් "සංඛ්‍යාන තොරතුරු පද්ධතිය (Lanka SIS)**

"ලංකා සිස් "තොරතුරු පද්ධතිය වැඩි දියුණු කිරීමේ හා යාවත්කාලීන කිරීම මගින් දත්ත භාවිතා කරන්නන්ට ඉතා පහසුවෙන් දෙපාර්තමේන්තු දත්ත ලබා ගැනීමේ හැකියාව ලැබී ඇත.

**X. ළමා ක්‍රියාකාරකම් පිළිබඳ සමීක්ෂණය 2016**

ළමා ක්‍රියාකාරකම් පිළිබඳ සංඛ්‍යාලේඛන සම්පාදනය කර අවසන් කර ඇත.

**XI. KOSTAT ව්‍යාපෘතිය**

කොස්ටැට් (KOSTAT) ව්‍යාපෘතිය මගින් ලබා දුන් ආධාර යටතේ නවීන පහසුකම් සහිත පරිගණක විද්‍යාගාර 2ක් ස්ථාපනය කරන ලදී. එසේම එම ආධාර යටතේ CAPI (Computer Assist Personal Interview) ක්‍රමවේදය පිලිබඳ පුහුණුවක්ද නිලධාරීන්ට ලබා දෙන ලදී.

**XII. රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සංගණනය 2016**

මෙම සංගණනය සඳහා පරිගණක වැඩසටහන් සකස් කිරීම සිදු කරන ලදී.

**XIII. පරිගණක ජාල ප්‍රතිව්‍යුහගත කිරීම**

Windows මෙහෙයුම් පද්ධතියේ active directory උපාංගය සුසර කිරීම සිදු කරන ලදී.

**XIV. පරිගණක නඩත්තු කිරීම හා අළුත්වැඩියාව**

දෙපාර්තමේන්තුව තුල පරිගණක ජාලයෙහි දෘඩාංග හා මෘදුකාංග සැහැල්ලු ක්‍රියාකාරිත්වයකට යොමු කිරීම සිදු කරන ලදී.

## 2.2.19 ප්‍රකාශන කටයුතු

දෙපාර්තමේන්තුවේ ඉදිරි වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම, වාර්ෂික කාර්ය සාධන වාර්තාව, සංඛ්‍යාන නිබන්ධනය, සංඛ්‍යාන අත්පොත (ඉංග්‍රීසි, සිංහල/දෙමළ), දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර සටහන් පොත සැකසීම සහ දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන බෙදා හැරීම ප්‍රකාශන අංශයේ මූලික කාර්යයන් වේ.

ක්ෂේත්‍ර ගණනාවක වසර කිහිපයක් දත්ත ඇතුලත්ව සකස් කරනු ලබන සංඛ්‍යාන නිබන්ධනය 2016 හා සංඛ්‍යාන අත්පොත 2016 අදාල කාල පරිච්ඡේදයන් තුලදී දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත්කල අතර මුද්‍රණය කොට බෙදා හරින ලදී.

දෙපාර්තමේන්තුවේ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා 2017 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම අනුමත ඇස්තමේන්තු යටතේ සකසන ලදී.දෙපාර්තමේන්තුවේ සියලුම අංශයන් හා දෙපාර්තමේන්තුවෙන් පරිබාහිරව අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලට අනුයුක්ත සංඛ්‍යාලේඛන අංශයන් මගින් ඉටු කරන ලද කාර්යයන් හා අදාළ වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තාවද ඇතුලත් වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2015 ප්‍රකාශයට පත්කල අතර එම වාර්තාවේ සංයුක්ත තැටි 350 ක් පාර්ලිමේන්තුව වෙත යැවීමට කටයුතු කරන ලදී.

දෙපාර්තමේන්තුවේ කාලීන තොරතුරු ඇතුලත් සංඛ්‍යාන පුවත් විවරණිකාව 2016 අර්ධ වාර්ෂිකවද විවිධ ක්ෂේත්‍රයන් යටතේ සකසන ලද සංඛ්‍යාන දත්ත පත්‍රිකාව 2016 ත්‍රිත්ව භාෂාවෙන්ම මුද්‍රණය කර බෙදා හරින ලද අතර දෙපාර්තමේන්තු වෙබ් අඩවිය මගින්ද ප්‍රකාශයට පත් කරන ලදී.

දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශනයන් සහ පුවත්පත් විවරණිකා සඳහා අදාළ වූ ISBN/ISSN අංක ලබා ගැනීමත් එකී ප්‍රකාශනයන් සඳහා මිල ගනන් කැඳවීමේ කටයුතු ද අදාළ කාලය තුල ඉටු කරන ලදී.

එක් රැස් කරනු ලබන දත්ත ප්‍රචලිත කිරීමේ මූලික වගකීම දෙපාර්තමේන්තුව සතුවේ. මෙම කාර්යය සාක්ෂාත් කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රකාශනයන්/පුවත් විවරණිකා ප්‍රමාදයකින් තොරව දේශීය/විදේශීය ආයතනයන් සහ පුද්ගලයන් අතර බෙදා හැරීම සිදු කරන ලදී.

මෙයට අමතරව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය සඳහා 2016.09.30 දක්වා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව පිලියෙල කරන ලදී.

## 2.2.20 මුද්‍රණ කටයුතු

දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබූ සංගණන හා සමීක්ෂණ වල පහත නම් සඳහන් වාර්තා මෙන්ම ඊට අදාල උපලේඛන, ප්‍රශ්නාවලීන් හා උපදෙස් අත්පොත් දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලය මගින් මුද්‍රණය කිරීම සිදු කරන ලදී.

I. සංඛ්‍යාන නිබන්ධනය 2015
II. ක්ෂේත්‍ර සටහන් පොත්
III. Paddy Statistics 2014/15 – Maha
IV. Key Indicators of Crop Production

v. ජන හා නිවාස සංගණනය - 2012 සංගණන අවසන් වාර්තා ( සබරගමු පළාත/දකුණු පළාත/උතුරු මැද පළාත,වයඹ පළාත, ඌව පළාත, උතුරු පළාත)
vi. ආර්ථික සංගණනය - 2013/14 කෘෂිකර්ම කටයුතු පිළිබඳ ගණන් ගැනීමේ නිලධාරීන්ගේ සහතික පත්‍ර
vii. Basic Statistics Module Book
viii. Estimated Extent and Production of Potato 2015
ix. ශ්‍රමබල සමීක්ෂණය වාර්තාව 2015 (I,III ,IV වන කාර්තු)
x. National Survey of self-reported Health in Sri Lanka 2014
xi. වී පිළිබඳ සංඛ්‍යාලේඛන 2015(යල කන්නය)
xii. Bulletin of Weekly Retail Prices 2015 (Colombo District)
xiii. විගණකාධිපති වාර්තාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)
xiv. Statistical Newsletter 2016 (1st Issue)
xv. Data Collection Post Module
xvi. කාර්ය සාධන වාර්තාව 2015
xvii. Health Report
xviii. Index of Industrial Production Report
xix. සංඛ්‍යාන දත්ත පත්‍රිකාව
xx. අමාත්‍යාංශ කාර්ය සාධන වාර්තාව
xxi. ශ්‍රමබල වාර්ෂික වාර්තාව 2015
xxii. රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සංගණනයේ අත්පොත් (සිංහල/දෙමළ)
xxiii. G.I.S.Application Module
xxiv. කාර්මික නිෂ්පාදන දර්ශකය වාර්කාව
xxv. අර්තාපල් නිෂ්පාදන ඇස්තමේන්තු විවරණිකාව
xxvi. සංගණන දත්ත පත්‍රිකාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)
xxvii. Statistical Pocket Book 2016
xxviii. Agricultural Statistics 2015
xxix. Bulletin of Selected Retail & Product Prices 2012-2015
xxx. ආහාර ශේෂ පත්‍ර (සිංහල)

### 2.2.21 සිතියම් විද්‍යා කටයුතු

2021 වර්ෂයේ පැවැත්වීමට නියමිත ජන හා නිවාස සංගණනය මූලික කොට ගෙන ගම්පහ, කුරුණෑගල, මොණරාගල, බදුල්ල හා කෑගල්ල දිස්ත්‍රික්කවල චන්ද්‍රිකා ඡායාරූප භාගත කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර රත්නපුර හා නුවරඑළිය දිස්ත්‍රික්කවල පිළිවෙලින් 17% ක් හා 25% ක් වශයෙන් අවසන් කර ඇත. එමෙන්ම එම දිස්ත්‍රික්කවල සහ මහනුවර, මාතලේ අම්පාර දිස්ත්‍රික්ක වල ද 2012 ජන හා නිවාස සංගණනයට භාවිතා කරන ලද සිතියම් පරිලෝකනය කිරීමේ කටයුතු ද අවසන් කර ඇත. භූගෝලීය දත්ත පද්ධතිය සකස් කිරීමේ කටයුතු ගම්පහ, කුරුණෑගල, මොණරාගල, බදුල්ල රත්නපුර, කෑගල්ල හා මහනුවර දිස්ත්‍රික්ක වල අවසන් කර ඇත. තව ද, කළුතර, ගම්පහ, කුරුණෑගල, හා බදුල්ල යන දිස්ත්‍රික්කවල සිතියම් Geo referencing කිරීමේ කටයුතු අවසන් කර ඇති අතර මොණරාගල සහ කෑගල්ල දිස්ත්‍රික්ක වල පිළිවෙලින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4 ක 5 ක සිතියම් Geo referencing කිරීමේ කටයුතු අවසන් කර ඇත. ග්‍රාම නිලධාරි කොට්ඨාශ සිතියම් අංකිත කිරීමේ කටයුතු කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්ක වල අවසන් කර ඇති අතර කුරුණෑගල, බදුල්ල හා මොණරාගල යන දිස්ත්‍රික්ක වල පිළිවෙලින් ග්‍රාම නිලධාරි කොට්ඨාශ සිතියම් වලින් 95%, 49% හා 09% ක් අවසන් කර ඇත. කෑගල්ල දිස්ත්‍රික්කයේ සිතියම් අංකිත කිරීම ආරම්භ කර ඇත. දකුණු හා උතුරු පළාත්වල දිස්ත්‍රික්කවල අංකිත කරන ලද සිතියම් පරීක්ෂා කර අවසන් කර ඇත.

දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලයට හා ග්‍රාම නිලධාරින්ට භාවිතයට අවශ්‍ය උපදෙස් අත්පොත් සකස් කර ඇති අතර සංගණන සිතියම් සකස් කිරීමේ ක්‍රමවේදය පරීක්ෂා කිරීම සඳහා කළුතර හා ගම්පහ දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර පරීක්ෂාව සිදුකරන ලදී. එමෙන්ම, ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස නවයකට අයත් සිතියම් මුද්‍රණය කර ඇත. තවද, රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ඒ සම්බන්ධ ආයතන වල ඉල්ලීම් මත අදාල සිතියම් සකස් කිරීමේ කටයුතු සිදු කර ඇත.

## 2.2.22 දත්ත නිකුත් කිරීමේ කටයුතු

### I. ක්ෂුද්‍ර දත්ත නිකුත් කිරීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ , ක්ෂුද්‍ර දත්ත නිකුත් කිරීමේ ප්‍රතිපත්තිය (Dissemination Policy on MicroData) අනුව මෙම වර්ෂය තුළදී දත්ත ඉල්ලීම් 72ක් සඳහා නොමිලයේද, ඉල්ලීම් 2ක් සඳහා මුදල් අයකිරීමේ පදනම මතද දත්ත නිකුත් කරන ලදී.

### II. පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම

ශ්‍රී ලංකා ජනරජයේ පාර්ලිමේන්තුවෙහි ගරු මැති ඇමතිවරුන්ගේ වාචික ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට අවශ්‍ය වන දත්ත හා තොරතුරු ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවනු ලබන ඉල්ලීම් සඳහා දත්ත ලබා දීම සිදු කරන්නේද මෙම ඒකකය මඟිනි. අදාල පාර්ලිමේන්තු ප්‍රශ්නයට අනුව දෙපාර්තමේන්තුවේ විවිධ අංශ සම්බන්ධීකරණය කරගනිමින් අදාල පිළිතුරු සකසා මුදල් අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු කටයුතු දෙපාර්තමේන්තුව වෙත කඩිනමින් ලබාදීම මෙහිදී සිදුකරනු ලැබේ. මෙවැනි ඉල්ලීම් 03 ක් 2016 වර්ෂයේ ලැබුණු අතර එම සියල්ලටම පිළිතුරු ලබා දීමට කටයුතු කරන ලදී.

### III. වෙනත් ආයතන වල දත්ත ඉල්ලීම් සඳහා තොරතුරු ලබාදීම

දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලබන විවිධ අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු අනෙකුත් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන සහ පුද්ගලයින් විසින් කරනු ලබන දත්ත ඉල්ලීම් සඳහා අදාල තොරතුරු සැපයීමද දත්ත නිකුත් කිරීමේ ඒකකය මඟින් සිදුකරනු ලබයි. මෙම වර්ෂය තුලදී සාමාන්‍ය තැපැල මඟින් හා විද්‍යුත් තැපැල මඟින් ලද දත්ත ඉල්ලීම් 280 කට පමණ තොරතුරු සැපයීම සිදු කර ඇත.

### IV. දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල දත්ත පද්ධතිය පවත්වාගෙන යාම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ, කාර්ය මණ්ඩල දත්ත පද්ධතිය පවත්වාගෙන යාම හා ඉහළ කළමනාකරණයේ අවශ්‍යතාවයන් සඳහා කාර්ය මණ්ඩල තොරතුරු ලබා දීම සිදුකරනු ලබන්නේ ද දත්ත නිකුත් කිරීමේ ඒකකය මඟිනි. දෙපාර්තමේන්තු පාලන අංශය මඟින් ලබා දෙන තොරතුරු මත මෙම වර්ෂයේදීද දත්ත පද්ධතිය යාවත් කාලීන කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

### V. දෙපාර්තමේන්තු ප්‍රකාශන අලෙවි කවුළුව පවත්වාගෙන යාම

දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන මුද්‍රිත ප්‍රකාශන අළෙවිය මෙම ඒකකයෙහි පිහිටුවා ඇති අලෙවි කවුළුව මඟින් සිදු කෙරේ. තවද 2016 පෙබරවාරි 02 සහ 03 යන දෙදිනට යෙදුණු කෝට්ටේ ශාන්ත තෝමස් විද්‍යාලයේ අධ්‍යාපනික ප්‍රදර්ශනය සඳහාද, 2016 ඔක්තෝම්බර් 12, 13 සහ 14 යන තෙදින කොළඹ අනුලා විද්‍යාලයේ අනුලා අභිමන් අධ්‍යාපනික ප්‍රදර්ශනය සඳහාද ඔවුන්ගේ ඉල්ලීම මත දෙපාර්තමේන්තු ප්‍රකාශණ අලෙවි කවුළුවක් පැවැත් වීමට මෙම ඒකකය විසින් දායකත්වය සපයන ලදී. එමෙන්ම, 2016 වර්ෂයේදී ප්‍රකාශන පිටපත් 552ක් සහ CD තැටි 02ක් අලෙවි කර ඇත.

### 2.2.23 පුස්තකාල සේවා

දෙපාර්තමේන්තු පුස්තකාලය විමර්ශන අංශය හා බැහැරදීමේ අංශය ලෙස කොටස් දෙකකින් සමන්විතය. බැහැරදීමේ අංශයේ සේවා දෙපාර්තමේන්තු නිලධාරීන්ට පමණක් ලබා දෙන අතර ඊට අමතරව පහත සඳහන් සේවාවන් පුස්තකාලයෙන් ලබා ගැනීමට පහසුකම් සලසා ඇත.

- විමර්ශන සේවා
- පටුන පිටු සේවා
- පුස්තකාල දත්ත පදනම ගවේශනය
- ඡායා පිටපත් සේවය
- අන්තර් පුස්තකාල පිරුළු සේවය

එසේම බාහිර පාඨකයින් සඳහා විමර්ශන සේවා පමණක් ලබා දෙනු ලැබේ.

දෙපාර්තමේන්තු ප්‍රකාශන එකතුව, ශ්‍රී ලංකා එකතුව, ජාත්‍යන්තර ප්‍රකාශන එකතුව සහ විවිධ විෂයයන්ට අදාළ පෙළ පොත් එකතුවකින් බැහැරදීමේ අංශය සමන්විතය. විමර්ශන අංශයේ පැරණි දෙපාර්තමේන්තු ප්‍රකාශන තැන්පත් කර ඇත. පුස්තකාලයේ නොමැති ප්‍රකාශන අවශ්‍යතාවක් වුවහොත් අන්තර් පුස්තකාල පිරුළු සේවාව යටතේ වෙනත් පුස්තකාලවලින් ප්‍රකාශන හුවමාරු කරගනු ලැබේ.

#### I. පුස්තකාල පොත් සංඛ්‍යාංකකරණය

අන්තර්ජාලය පදනම් කරගත් පුස්තකාල ස්වයංක්‍රියකරණ සූචිය (Web Based Automated Library Catalogue System) ව්‍යාපෘතිය යටතේ පුස්තකාල පොත් සහ පාඨකයින් පිළිබඳ තොරතුරු මෙම දත්ත පදනමට ඇතුළත් කිරීම මේ වන විට නිමකර ඇත. මේ සඳහා විවෘත මෘදුකාංගයක් වන KOHA භාවිත කරනු ලැබේ.

#### II. පොත් මිලදී ගැනීම

දෙපාර්තමේන්තු නිලධාරීන්ගෙන් ලබාගත් විවිධ විෂයයන්ට අදාළ (සංඛ්‍යානය, පරිගණක විද්‍යාව, ආර්ථික විද්‍යාව, සාමාන්‍ය දැනීම, සාහිත්‍යය) පොත් ලැයිස්තු සහ පුස්තකාලයාධිපතින් විසින් තෝරාගත් පොත් ලැයිස්තු ප්‍රකාශන ආයතන වෙත ගොස් තෝරා පොත් 200ක් පමණ මිලදී ගැනීම් සිදුකරන ලදී.

#### III. පුවත්පත් අංශය

පුස්තකාලයට ලබාගන්නා සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් ප්‍රකාශිත පුවත්පත් දෛනිකව ලබාගැනීම සහ දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත හා දෙපාර්තමේන්තුවට අදාළ පුවත් උපුටන අදාළ අංශ වෙත දෛනිකව ඡායා පිටපත් කර ලබා දීම සහ අවශ්‍ය අවස්ථාවල දී උපුටනවලට අදාළ අන්තර්ජාල ලිපින (Web Link) තොරතුරු තාක්ෂණ අංශය වෙත ලබා දේ.

#### IV. ව්‍යාප්ති සේවා

- **පටුන පිටු සේවය (Content Page Service)**

පුස්තකාලයට දේශීය හා විදේශීය වශයෙන් ලැබෙන පොත්පත් සහ වාර ප්‍රකාශන පිළිබඳ දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීම සඳහා මෙම සේවාව ක්‍රියාත්මක වේ. මෙය මාසිකව විද්‍යුත් තැපැල හරහා නිලධාරීන් දැනුවත් කරනු ලැබේ.

➢ **"අනුලා අභිමන්" අධ්‍යාපනික ප්‍රදර්ශනය**

නුගේගොඩ අනුලා විද්‍යාලයට වසර 75ක් සපිරීම වෙනුවෙන් සංවිධානය කරන ලද "අනුලා අභිමන්" අධ්‍යාපනික ප්‍රදර්ශනය සඳහා දෙපාර්තමේන්තුව වෙනුවෙන් ප්‍රදර්ශන කුටියක් දින තුනක් පුරා පවත්වාගන යන ලදී.

➢ **පුස්තකාල දත්ත පදනම පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන**

දෙපාර්තමේන්තු පුස්තකාල දත්ත පදනම (KOHA) පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීමේ එක් දින වැඩසටහනක් පුහුණු අංශයේ දී පවත්වන ලදී.

v. **පුස්තකාල පොත් සංගණනය**

දෙපාර්තමේන්තුවේ වත්කම් කළමනාකරණ අංශයේ මග පෙන්වීම යටතේ සිදුකරන ලද මෙම සමීක්ෂණය දෙපාර්තමේන්තු පුස්තකාලයේ පොත් සමීක්ෂණයක් සිදු කරන ලද පළමු අවස්ථාවයි. මෙම වාර්ෂික සමීක්ෂණය මගින් ලබා ගන්නා දත්ත මගින් පුස්තකායේ කළමනාකරණය පිළිබඳ ඉදිරි තීරණ ගැනීමට පිටිවහලක් ලැබේ.

## 2.2.24 ක්ෂේත්‍ර කළමණාකරණ කටයුතු

දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ හා ප්‍රධාන කාර්යාලය අතර සම්බන්ධීකරණ කටයුතු මනාව පවත්වා ගෙන යමින් ඒ ඒ අංශයන්ට අදාළ වූ විවිධ ප්‍රතිපාදන, භෞතික සම්පත් සපයා දීම මේ යටතේ සිදු කෙරේ. ඒ අනුව කාර්තුමය වශයෙන් දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානීන්ගේ හා ක්ෂේත්‍ර නිලධාරීන්ගේ මාසික ගමන් වියදම්, තැපැල් හා සන්නිවේදන ලිපිද්‍රව්‍ය, ඉන්ධන සඳහා ප්‍රතිපාදන, රියදුරු බටා, අතිකාල දීමනා සහ විදුලිය, ජලය, සනීපාරක්ෂක කටයුතු වැනි කාර්යාලීය අවශ්‍යතා සඳහා අවශ්‍ය ප්‍රතිපාදන යැවීම සිදු කෙරේ.

මෙම වර්ෂය සඳහා වූ දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානීන්ගේ වාර්ෂික වැඩමුළුව, 2016.04.04 සහ 05 දෙදින තුල හෙක්ටර් කොබ්බැකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු ආයතනයේදී පවත්වන ලද අතර දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ ප්‍රධානීන්ගේ දෙවන වාර්ෂික වැඩමුළුව 2016.12.22 සහ 23 යන දිනයන්හි දී නිවාස සැලසුම් හා ගොඩනැඟිලි මධ්‍යස්ථානයේදී ද පැවැත්විණි.

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ පළාත් සභාවල පිහිටුවා ඇති සංඛ්‍යාලේඛන අංශ වල රාජකාරි කටයුතු විමර්ශනය කිරීම, ප්‍රගතිය, මුහුණ පා ඇති ගැටළු හා විසඳුම් යෝජනා සාකච්ඡා කිරීම ප්‍රජා විද්‍යාත්මක, කර්මාන්ත හා කෘෂිකාර්මික කමිටු රැස්වීම් පැවැත්වීම මගින් සිදු කරන ලදී.

කාර්යක්ෂම දිස්ත්‍රික් කාර්යාලය තේරීමේ ක්‍රමවේදය, අධීක්ෂණ රාජකාරි පවරනු ලබන ප්‍රධාන කාර්යාලයීය අංශ මගින් ගෙන්වාගනු ලබන වාර්තා පදනම් කරගෙන සිදුකරන ලද පූර්ව පරීක්ෂාවක් ලෙස ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව අදාල ඇගයීම් වාර්තා මෙම අංශයට ලැබෙමින් පවතී.

දිස්ත්‍රික් සංඛ්‍යාන අත්පොත සැකසීම සඳහා අවශ්‍ය අදාල දත්ත වගුවල ආදර්ශ සහ ලිඛිත උපදෙස් දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ වෙත ලබාදී ඇත. 2014 වර්ෂයේ සිට සංඛ්‍යාන අත්පොත සැකසීම දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශවලින්ම සිදුකරනු ලබන බැවින් ඒ සඳහා අදාල දිස්ත්‍රික් නිලධාරින් සඳහා පුහුණු වැඩමුළුවක් 2016 මාර්තු 17 සහ 18 දිනයන්හි පුහුණු අංශයේ දී පවත්වන ලදී. මේ සඳහා දිස්ත්‍රික් සංඛ්‍යාන අත්පොත සකස් කරනු ලබන නිලධාරින් සහභාගීවිය. දිස්ත්‍රික්ක 16 ක සංඛ්‍යාන අත්පොත මුද්‍රණය කර අවසන් කර ඇත.

2017 දිස්ත්‍රික් සංඛ්‍යාන අත්පොත සකස් කිරීමේ දී සිදුකළයුතු සංශෝධන සාකච්ඡා කිරීමේ කමිටුවක් 2016.12.06 සහ 07 දිනවල රැස්වී සාකච්ඡා කරන ලදී. ඒ සඳහා දිස්ත්‍රික්ක 05 ක සංඛ්‍යාන අත්පොත සකස් කරනු ලබන නිලධාරින් සහභාගීවිය.

## 2.3 අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ස්ථාපිත කර ඇති සංඛ්‍යාලේඛන ශාඛා කාර්යාල මගින් පවත්වනු ලබන සංගණන සහ සමීක්ෂණ

### 2.3.1 වාර්ෂික රැකීරක්ෂා සමීක්ෂණය

මෙමගින් දිවයිනේ පිහිටි පෞද්ගලික හා රාජ්‍ය යන දෙඅංශයෙහි සේවක අර්ථසාධක අරමුදලට දායකවන ව්‍යාපාර සහ සේවා ආයතන සම්බන්ධව වසරේ ජුනි මස අවසන් වැඩ කරන දිනය පදනම්ව තොරතුරු , ස්ථර අනුව ප්‍රමාණයට සමානුපාතිකව තෝරාගත් නියැදියක් ඇසුරින් තැපැල් මගින් වාර්ෂිකව තොරතුරු රැස් කිරීම සිදු කරනු ලැබේ. මෙම වාර්තාව මගින් දිවයිනෙහි සංවිධානය වූ සේවා නියුක්තිය, කර්මාන්ත හා වෘත්තීය වර්ගීකරණ තොරතුරු ඇතුළුව කම්කරු ක්ෂේත්‍රට අදාළ තවත් තොරතුරු රැසක් වාර්ෂිකව පවත්වනු ලබන “ Annual Employment Survey ” ප්‍රකාශනය මගින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

### 2.3.2 සාමාන්‍ය ඉපැයීම් සහ වැඩ කල පැය ගණන පිළිබඳ සමීක්ෂණය

මෙම සමීක්ෂණය මගින් පඩි පාලක සභා ආඥා පනත යටතේ වේතන ලබන ආයතනවල පවතින සේවා තත්ත්ව අනුව සේවකයින්ගේ ඉපැයීම් වල වෙනස්වීමේ ආකාරය අධ්‍යයනය කරනු ලබයි. මෙහිදී පඩිපාලක සභා අනුව තෝරාගත් ආයතන වලින් සෑම වසරකම මාර්තු සහ සැප්තැම්බර් මාස වලදී වර්ෂයකට දෙවරක් තැපැල් මාර්ගිකව තොරතුරු රැස්කරනු ලබයි. එක් එක් සේවා තත්ත්ව අනුව ඉපැයීම් පිලිබද තොරතුරු රැස් කර වාර්ෂිකව ප්‍රකාශයට පත්කරනු ලබන “ The Survey on hours of actually worked and average earings ” ප්‍රකාශණය මගින් ප්‍රකාශයට පත් කරනු ලබන අතර එමගින් සේවා තත්ව අනුව ඉපැයීම් රටාව විග්‍රහ කරනු ලැබේ.

### 2.3.3 පඩිපාලක සභා අවම වැටුප් දර්ශකාංකය ගණනය කිරීම

පඩි පාලක සභා ආඥා පනත යටතේ කම්කරු දෙපාර්තමේන්තුව මගින් පඩි පාලක සභා අනුව නියම කරනු ලබන අවම වැටුප් පදනම් කොට මාසිකව අවම වැටුප් අනුපාත දර්ශකාංකය ගණනය කරනු ලැබේ. මෙම දර්ශකාංකය කෘෂි (වැවිලි අංශය) කර්මාන්ත, වාණිජ, සේවා යන ප්‍රධාන අංශ සඳහා වෙන් වෙන්ව හා ඒකාබද්ධව ගණනය කරනු ලබන අතර එමගින් ආර්ථිකයේ ප්‍රධාන අංශ වල අවම වැටුප් මට්ටම්වල වෙනස් නිරීක්ෂණය කරනු ලැබේ. ඉහත දර්ශකය, ශ්‍රී ලංකා මහ බැංකුව, ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය ඇතුළු විවිධ ආයතන වලට මාසිකව, කාර්තුමය සහ වාර්ෂික මට්ටම් වලින් ලබාදෙනු ඇත.

### 2.3.4 කම්කරු සංඛ්‍යාති ප්‍රකාශනය ප්‍රකාශයට පත් කිරීම

දේශීය දත්ත ප්‍රයෝජනයට ගන්නන් සඳහා ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳ පොල ආශ්‍රිත කම්කරු සංඛ්‍යාතීන් හා ඒ සමග සහ සම්බන්ධ වූ ජනගහනය හා ප්‍රජා විද්‍යාත්මක තොරතුරු සහ ශ්‍රම බලකාය, මිල, වැටුප් හා ආදායම් වියදම් සම්බන්ධව සාමාන්‍ය සමාජ ආර්ථික සහ කම්කරු සම්බන්ධතා, කම්කරු ආඥා පනත් ක්‍රියාත්මක කිරීම පිළිබඳව තොරතුරු අඩංගු “ කම්කරු සංඛ්‍යාති” ප්‍රකාශනය වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන අතර, මේ සඳහා කම්කරු දෙපාර්තමේන්තුවට අමතරව ශ්‍රී ලංකාවේ විවිධ දෙපාර්තමේන්තු සහ ආයතන වලින් අවශ්‍ය තොරතුරු ලබා ගනු ලැබේ.

දිවයිනේ සියලු කම්කරු කාර්යාල වලින් කම්කරු අණ පනත් ඇසුරින් සිදුකරනු ලබන කම්කරු සුපරීක්ෂණ මාසික වාර්තා පෝරම 14 ක් මගින් ලබා ගන්නා තොරතුරු සහ සේවක අර්ථසාධක අරමුදලට දායක වන නව ආයතන ශ්‍රී ලංකා සම්මත කර්මාන්ත වර්ගීකරණය (Sri Lanka Standard Industry Classification) මත CSpro දත්ත පද්ධතියක් වෙත ඇතුලත් කර තොරතුරු යාවත්කාලීන කිරීම සිදු කරන ලදී.

### 2.3.5 අධ්‍යාපන සංඛ්‍යාති

අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථාපිත කොට ඇති සංඛ්‍යාලේඛන ශාඛාව මඟින් වාර්ෂිකව සිදුකරනු ලබන රජයේ පාසල් සංගණනයට සමගාමීව පුද්ගලික පාසල්, පිරිවෙන්, ගුරු අභ්‍යාස විද්‍යාල හා අධ්‍යාපන විද්‍යාපීඨ පිළිබඳව ද 2016 වර්ෂයට අදාළ ව දත්ත හා තොරතුරු රැස් කරන ලදි.

2015 හා 2016 වර්ෂවලට අදාළ රජයේ පාසල්, පිරිවෙන්, පෞද්ගලික පාසල්, ගුරු අභ්‍යාස විද්‍යාල හා අධ්‍යාපන විද්‍යාපීඨ පිළිබඳ හා නොවිධිමත් අධ්‍යාපන අංශයන්හි සංගණන කටයුතු අවසන් කර අදාළ දත්ත පද්ධති සකස් කර අවසන් වී ඇති අතර, එම වර්ෂවලට අදාළ මූලික වාර්තා නිකුත් කර ඇත.

### 2.3.6 වෛද්‍ය සංඛ්‍යාති

වෛද්‍ය සංඛ්‍යාලේඛන අංශය මගින් රට පුරා විසිරී ඇති රජයේ රෝහල් පද්ධතිය මගින්, අභ්‍යන්තර රෝගී හා මරණ, රෝගී ඇඳන් , සායන , බාහිර රෝගීන්, මාතෘ හා ළමා, මානව සම්පත්, විශේෂඥ වෛද්‍යවරුන් හා දන්ත වෛද්‍ය සේවා යන ක්ෂේත්‍රයන් පිළිබඳව දත්ත රැස් කරන අතර අදාල ආකෘති පත්‍ර එම ආයතන වෙත නිකුත් කර, සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍ර නියමිත කාලයේදී ලබා ගනී.

2016 හි අවසාන කාර්තුවට අදාලව අභ්‍යන්තර රෝගීන් පිළිබඳ දත්ත හා බාහිර රෝගීන් පිළිබඳ දත්ත ලැබෙමින් පවතින අතර මාසිකව ලැබෙන මාතෘ හා ළමා සංඛ්‍යාති ලැබීම් සතුටුදායකය. 2016.12.31 ට අදාලව රැස් කරන මානව සම්පත්, විශේෂඥ වෛද්‍ය හා රෝගී ඇඳන් සංඛ්‍යාලේඛන ලැබෙමින් පවතී. 2016 වර්ෂය සඳහා දන්ත වෛද්‍ය සේවා දත්ත රැස් කිරීම සඳහා නව ආකෘතියක් හඳුන්වා දෙනු ලැබීය. එම මාසික වාර්තා මහරගම, මුඛ සෞඛ්‍ය ආයතනය හරහා අංශයට ලැබේ.

2015 වර්ෂය අවසාන වන විට 2011 වර්ෂයෙහි දත්ත විශ්ලේෂණය අවසන් කළද ඊට පෙර හා පසු වර්ෂයන්හි දත්තයන් හා සංසන්දනය කර අවසාන දත්ත ගොනු සකස් කිරීම මෙම වර්ෂයේදී සිදු කරන ලදි. එහෙත් 2014 වර්ෂයේ දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රමුඛත්වය දීමත් ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය හා ප්‍රජා විද්‍යා හා සෞඛ්‍ය සමීක්ෂණය සඳහා කාර්ය මණ්ඩලය නිදහස් කිරීමට සිදු වීමත් නිසා 2011 වර්ෂයට අදාල අවසාන දත්ත ගොනු සකස් කිරීම ප්‍රමාද විය.

2014 වර්ෂයට අදාලව දත්ත විශ්ලේෂණය අවසන් කළ අතර 2015 හි දත්ත ගොනු වල නිරවද්‍යතාවය පරීක්ෂා කරමින් පවතී. එයට සමගාමීව දත්ත පරිසනක ගත කිරීම සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙලක් යෙදූ අතර මෙම වර්ෂය තුළදී 2014, 2015 වර්ෂවල දත්ත පරිසනක ගත කර අවසන් කර 2016 වර්ෂයේ දත්ත වලින්ද 40% ක් පමණ පරිසනකගත කර අවසන් කරන ලදි. 2015 හා 2016 දන්ත වෛද්‍ය සේවය පිළිබඳ දත්ත පරිසනකගත කිරීම සඳහා නව වැඩසටහන් සම්පාදනය කරන ලද අතර 2015 වර්ෂයේ දත්ත පරිසනකගත කර අවසන් කරන ලදි. 2016 වර්ෂයේ දත්ත ඇතුලත් කරමින් පවතී.

2014 වර්ෂයට අදාල වාර්ෂික සෞඛ්‍ය සංග්‍රහයේ වැඩ කටයුතු අවසන් කර ප්‍රකාශයට පත් කරන ලදි. එමෙන්ම 2014 වාර්ෂික සෞඛ්‍ය සංග්‍රහය සෞඛ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදි. 2015 වාර්ෂික සෞඛ්‍ය සංග්‍රහයේ 5 වන හා 6 වන පරිච්ඡේද සඳහා අදාල අංශවලින් සකස් කරන ලද ලිපි එකතු කර ප්‍රකාශයට සුදුසු පරිදි සකස් කරමින් පවතී.

2010 වර්ෂයේදී හඳුන්වා දුන් eIMMR ව්‍යාපෘතිය 2012 වර්ෂයේදී රෝහල්වල ස්ථාපනය කිරීම ආරම්භ කළ අතර 2013 වර්ෂයේදී රෝහල් 98 ක සාර්ථකව ස්ථාපනය කිරීමට හැකි විය. එමෙන්ම 2014 වර්ෂයේදී අළුතින් රෝහල් 75 ක්ද, 2015 වර්ෂයේදී අළුතින් රෝහල් 127 ක්ද, 2016 වර්ෂයේදී අළුතින් රෝහල් 124 ක්ද ඇතුලත් වූ අතර දැනට මෙම ව්‍යාපෘතිය රට පුරා රෝහල් 424 ක ක්‍රියාත්මක වේ.

2016 වර්ෂය සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල මට්ටමින් ජනගහන ඇස්තමේන්තු සකස් කර ප්‍රකාශනයට පත් කරන ලදි. මේ සඳහා ජන හා නිවාස සංගණනය - 2012 හි අවසාන වාර්තාවෙහි ග්‍රාම නිලධාරි කොට්ඨාශ ජනගහනය පාදක කර ගනු ලැබීය. 2017, ජනගහන ඇස්තමේන්තුව පිළියෙළ කිරීමට අවශ්‍ය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල ලැයිස්තුව යාවත්කාලීන කිරීම ද නිම කර ඇත.

2016 වර්ෂයේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල 26 හිම eIMMR පද්ධතිය සම්බන්ධ පුහුණු වැඩසටහන් පවත්වන ලද අතර කැළණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ සිසුන්, වෛද්‍ය සංඛ්‍යාලේඛන පිළිබඳව දැනුවත් කිරීම සඳහා දේශන පවත්වන ලදි.

### 2.3.7 ජීව සංඛ්‍යාති

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන අංශය මගින් ශ්‍රී ලංකාවේ වාර්ෂිකව ලියාපදිංචි කරනු ලබන උපත්, විවාහ හා මරණ සංඛ්‍යාව හා ඊට අදාල ප්‍රජා විද්‍යාත්මක තොරතුරු හා මරණයට හේතු යන දත්ත රැස් කොට එම තොරතුරු වාර්තා මගින් ප්‍රකාශයට පත් කිරීම සිදු කරනු ලබයි.මේ වන විට 2011, 2012, 2013 වසර සඳහා මරණ වලට අදාල යාවත්කාලීන දත්ත ප්‍රකාශයට පත් කොට ඇති අතර, 2014 වසර සඳහා අදාල දත්ත පරිගණක ගත කිරීම අවසන් කර ඇත. එමෙන්ම, 2014 වසර සඳහා අවසන් දත්ත ප්‍රකාශයට පත් කිරීම සඳහා සකස් කරමින් පවතී. 2015 සහ 2016 වසර වලට අදාල ප්‍රජාවිද්‍යාත්මක දත්ත මේ වන විට දිස්ත්‍රික් කාර්යාල වලින් ලැබෙමින් පවතී.

මීට අමතරව මධ්‍ය වාර්ෂික ජනගහනය ඇස්තමේන්තු කිරීමේ කටයුතු මෙම අංශය මගින් සිදු කෙරෙන අතර 2016 වර්ෂය සඳහා වයස් කාණ්ඩ සහ දිස්ත්‍රික් අනුව මධ්‍ය වාර්ෂික ජනගහනය සකස් කර දත්ත භාවිතා කරන්නන්ට ලබා දී ඇත. 2015 වර්ෂයට අදාල ජීව සංඛ්‍යාති දර්ශක (උදා : දළ උපත් අනුපාතිකය, දළ මරණ අනුපාතිකය, ජනගහන ඝනත්වය, උපතේදී පුමිතිරි අනුපාතය, ජනගහන වර්ධන අනුපාතිකය, ස්වභාවික වර්ධන අනුපාතිකය, යැපුම් අනුපාතය ආදිය) සකස් කිරීම අවසන් කර ඇත.

### 2.3.8 රේගු සංඛ්‍යාති

ශ්‍රී ලංකා රේගුවේ ස්වයංක්‍රීය දත්ත සැකසුම් අංශයෙන් පරිගණක ගත කරන ලද ආනයන/අපනයන සම්බන්ධ දත්ත දිනපතාම ලබා ගැනීමත් බාහිර වෙළඳ සංඛ්‍යාති වලට අදාල තොරතුරු සකස් කිරීමත් ආනයන/අපනයන හා ප්‍රති අපනයන ලෙස දත්ත වෙන්කර ගොනු සකස් කිරීමත් දෝෂ සහිත දත්ත නිවැරදි කරමින් මාසික දෝෂ රහිත පරිගණක දත්ත ගොනු සකස් කිරීම හා සංඛ්‍යාන දත්ත අලෙවි අංශය කාර්යක්ෂමව පවත්වාගෙන යාමත් වගකීම් දරන ප්‍රධාන ක්ෂේත්‍ර වේ. බාහිර වෙළඳ සංඛ්‍යාති අදාල මාසය අවසන්ව දින 15 ක කාලය තුලදී මාසිකව සකස් කර ශ්‍රී ලංකා මහ බැංකුවට,මහ භාණ්ඩාගාරයට, ජාතික ගිණුම් සකස් කිරීම සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවට,විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලට ,දේශීය හා විදේශීය ආයතන වලට, තානාපති කාර්යාල වලට හා පර්යේෂකයන්ට නිකුත් කර ඇත.

### 2.3.9 ධීවර සංඛ්‍යාති

වෙරළාශ්‍රිත හා ගැඹුරු මුහුදේ මත්ස්‍ය නිෂ්පාදනය, තොග සහ සිල්ලර මත්ස්‍ය මිල ගණන් සහ මත්ස්‍ය නිෂ්පාදනය සහ ආනයනය අපනයනය දත්තයන් එක්රැස් කිරීම ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ සංඛ්‍යාලේඛන අංශය මගින් ඉටු කරනු ලබයි.

ධීවර සංඛ්‍යාති - 2016 ප්‍රකාශනය මුද්‍රණය සඳහා සකස් කර ඇත. විශාල සමුද්‍රික මත්ස්‍ය නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීම සඳහා වැඩ සටහන යටතේ දත්ත රැස්කිරීම සිදු කළ අතර එම දත්ත පරිගණක ගත කෙරෙමින් පවතී. එලෙසින්ම අයිස් යාත්‍රාගාර සහ ශීතාගාර පිළිබඳ දත්ත රැස් කිරීමේ සමීක්ෂණය - 2016 හි සමීක්ෂණ රාමුව 75% ක් පමණ සංශෝධනය කෙරින. මීට අමතරව ධීවර යාත්‍රාංගන පිළිබඳ සමීක්ෂණයේ මූලික දත්ත රැස් කර ඇති අතර අදාල ප්‍රකාශනය ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

# 3. පරිපාලනය

## 3.1 අංශ, ශාඛා කාර්යාල හා දිස්ත්‍රික් කාර්යාල

### 3.1.1 අංශ සහ ඒකක

පහත දැක්වෙන තාක්ෂණික හා සේවා අංශ 15 කින් සහ ඒකක 01ක් මගින් 2016 වසර තුල කාර්යයයන් මෙහෙය වන ලද අතර අභ්‍යන්තර විගණන අංශයකින් ද සමන්විත වේ.

| | |
|---|---|
| 1 වන අංශය | ජන සංගණන හා ප්‍රජා විද්‍යා |
| 2 වන අංශය | කර්මාන්ත, ඉදිකිරීම්,වෙළඳ හා සේවා |
| 3 වන අංශය | කෘෂිකර්ම හා පාරිසරික |
| 4 වන අංශය | ජාතික ගිණුම් |
| 5 වන අංශය | ප්‍රකාශන |
| 6 වන අංශය | පුස්තකාල හා ප්‍රලේඛන |
| 7 වන අංශය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ |
| 8 වන අංශය | ආයතනික හා ගිණුම් |
| 9 වන අංශය | නියැදි සමීක්ෂණ |
| 10 වන අංශය | මුද්‍රණ |
| 11 වන අංශය | ක්ෂේත්‍ර කළමණාකරණ |
| 12 වන අංශය | පුහුණු |
| 15 වන අංශය | පර්යේෂණ හා විශේෂ අධ්‍යයන |
| 16 වන අංශය | මිල හා වේතන |
| 18 වන අංශය | සිතියම් විද්‍යා |

දත්ත නිකුත් කිරීමේ ඒකකය
අභ්‍යන්තර විගණන අංශය

### 3.1.2 අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල පිහිටි ශාඛා කාර්යාල

මෙම දෙපාර්තමේන්තුව විසින් විවිධ දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ තුල ශාඛා කාර්යාල 40 ක් පවත්වාගෙන යයි. මෙම ශාඛා කාර්යාල නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු, ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥවරයෙකු, සංඛ්‍යාලේඛනඥවරයෙකු, සංඛ්‍යාලේඛන නිලධාරීවරයෙකු හෝ සංඛ්‍යාලේඛන සහකාර නිලධාරිවරයෙකු යටතේ පවතී.

### 3.1.3 දිස්ත්‍රික් කාර්යාල

දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත කොට ඇති දිස්ත්‍රික් කාර්යාල 25 ක් සහ මහවැලි සංවර්ධන බල ප්‍රදේශයට අයත් මහවැලි එච් කලාපයේ තඹුත්තේගම එක් කාර්යාලයක්ද වේ. මෙම කාර්යාල නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු, ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥවරයෙකු හෝ සංඛ්‍යාලේඛනඥවරයෙකු භාරයේ පවතින අතර ඔහුට සහාය වීමට සංඛ්‍යාලේඛන නිලධාරින් සහ සංඛ්‍යාලේඛන සහකාරවරුන් ද අනුයුක්ත කොට ඇත.ඒ ඒ දිස්ත්‍රික්කය තුළ දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සමීක්ෂණ, සංගණන වලට අදාලව දත්ත රැස් කිරීම මෙම කාර්යාල මඟින් සිදු කෙරේ. දිස්ත්‍රික්කය තුළ සංඛ්‍යාලේඛන කටයුතු පිළිබඳ සම්බන්ධීකරණය කරනු ලබන්නේද මෙම දිස්ත්‍රික් කාර්යාල මඟිනි.

## 3.1.4 පළාත් සභාවල සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලය

වෘත්තීය දක්ෂතා පෙන්වන සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කරමින් පලාත් සභාවලට සංඛ්‍යාලේඛන සේවාව සැපයීම දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. මේ අනුව කාර්ය මණ්ඩලය තාවකාලික පදනම මත මෙම දෙපාර්තමේන්තුවෙන් මුදා හැරීමෙන් පළාත් සභාවලට අනුයුක්ත කර ඇත. වඩාත් සුදුසු සංඛ්‍යානමය සම්බන්ධීකරණය, සංඛ්‍යාලේඛන ප්‍රමිතීන් පවත්වාගෙන යාම හා කාර්ය මණ්ඩලයේ උපරිම ප්‍රයෝජන ලබා ගැනීම මෙමඟින් තහවුරු කර ඇත. තාවකාලික මුදා හැරීම මගින් දෙපාර්තමේන්තුව මෙම නිලධාරීන් සැපයීමට පළාත් සභා සමඟ වැඩ සටහන් සම්පාදනය කරන ලදී.

## 3.2 කාර්ය මණ්ඩලය

| | තනතුර | අනුමත සංඛ්‍යාව | 2016.12.31 දිනට සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 |
| 2 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(සංඛ්‍යාන) | 3 | 1 | 2 |
| 3 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(තොරතුරු තාක්ෂණ) | 1 | 0 | 1 |
| 4 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(පරිපාලන) | 1 | 1 | 0 |
| 5 | අධ්‍යක්ෂ (සංඛ්‍යාන) | 11 | 4 | 7 |
| 6 | අධ්‍යක්ෂ (පරිපාලන) | 1 | 0 | 1 |
| 7 | අධ්‍යක්ෂ(තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය) | 2 | 0 | 2 |
| 8 | ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | 0 |
| 9 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 |
| 10 | නියෝජ්‍ය අධ්‍යක්ෂ(සංඛ්‍යාන) | 34 | 0 | 34 |
| 11 | නියෝජ්‍ය අධ්‍යක්ෂ(තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය) | 6 | 3 | 3 |
| 12 | නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ(පරිපාලන) [1] | 1 | 1 | 0 |
| 13 | සහකාර අධ්‍යක්ෂ(තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය) | 14 | 6 | 8 |
| 14 | ගණකාධිකාරී [1] | 2 | 2 | 0 |
| 15 | අභ්‍යන්තර විගණක [1] | 1 | 0 | 1 |
| 16 | ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ [3] | 200 | 30 | 0 |
| 17 | සංඛ්‍යාලේඛනඥ [1,7] | | 114 | 56 |
| 18 | මුද්‍රණ කළමණාකරු [1] | 1 | 0 | 1 |
| 19 | පරිපාලන නිලධාරි | 1 | 1 | 0 |
| 20 | සංඛ්‍යාලේඛන සැළසුම්කරු | 1 | 0 | 1 |
| 21 | පුස්තකාලයාධිපති | 3 | 3 | 0 |
| 22 | භාෂා පරිවර්තක | 3 | 2 | 1 |
| 23 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | 30 | 12 | 18 |
| 24 | සංඛ්‍යාලේඛන නිලධාරී | 494 | 336 | 158 |
| 25 | සංඛ්‍යාලේඛන සහකාර [2] | 202 | 189 | 0 |
| 26 | සංවර්ධන නිලධාරි | 64 | 57 | 7 |
| 27 | අයවැය සහකාර [2] | 1 | 1 | 0 |

| | | | | |
|---|---|---|---|---|
| 28 | සිතියම් විද්‍යාඥ | 1 | 1 | 0 |
| 29 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 250 | 227 | 23 |
| 30 | මුද්‍රණ නිමැවුම්කරු | 5 | 0 | 5 |
| 31 | මුද්‍රණ කාර්මික | 2 | 0 | 2 |
| 32 | කාර්මික නිලධාරි | 1 | 0 | 1 |
| 33 | පෙර මුද්‍රණ සැලසුම්කරු | 2 | 0 | 2 |
| 34 | ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු | 1 | 0 | 1 |
| 35 | පද්ධති පාලක [3] | 6 | 2 | 0 |
| 36 | ජ්‍යොෂ්ඨ පද්ධති ක්‍රියාකරු [3] | 4 | 3 | 0 |
| 37 | වැඩ මූලික (මුද්‍රණ) | 1 | 0 | 1 |
| 38 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 170 | 112 | 58 |
| 39 | දත්ත සටහන් ක්‍රියාකරු | 8 | 5 | 3 |
| 40 | දත්ත සටහන් ක්‍රියාකරු/කේත ලිපිකරු | 42 | 36 | 6 |
| 41 | ලිපිකරු (සිංහල මාධ්‍ය) | 10 | 9 | 1 |
| 42 | ලිපිකරු (දෙමළ මාධ්‍ය) | 20 | 17 | 3 |
| 43 | කැමරා ක්‍රියාකරු [3] | 1 | 1 | 0 |
| 44 | ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරු [5] | 1 | 1 | 0 |
| 45 | තහඩු සාදන්නා [4] | 1 | 1 | 0 |
| 46 | යන්ත්‍ර පරිචාරක [3] | 2 | 2 | 0 |
| 47 | ටයිප් සෙටර් [6] | 1 | 1 | 0 |
| 48 | රියදුරු | 55 | 50 | 5 |
| 49 | වායුසමීකරණ යන්ත්‍ර ක්‍රියාකරු [3] | 1 | 1 | 0 |
| 50 | මුද්‍රණ යන්ත්‍ර සහායක | 1 | 0 | 1 |
| 51 | කාර්යාල කාර්ය සහායක තනතුරු (ස්ථිර) | 107 | 99 | 8 |
| 52 | කාර්යාල කාර්ය සහායක තනතුරු (දෙපාර්තමේන්තුගත) | 10 | 9 | 1 |
| | **එකතුව** | **1783** | **1343** | **422** |
| | උපාධිධාරී අභ්‍යාසලාභී | 0 | 4 | 0 |
| | රියදුරු (අනියම්) | 3 | 2 | 1 |
| | කාර්යාල කම්කරු | 3 | 1 | 2 |
| | **එකතුව** | **1789** | **1350** | **425** |

1 මෙම තනතුරු අදාළ සේවයේ තනතුරේ /III හෝ II පන්තියේ තනතුරු වේ. සේවක සංඛ්‍යා සීමාවකින් තොරව ශ්‍රේණිගත උසස්වීම් ලබා දෙන බැවින් II ශ්‍රේණියට හෝ I ශ්‍රේණියට උසස්වීමෙන් අනතුරුව වුවද මෙම තනතුරෙහිම රැඳී සිටීමට එම නිලධාරීන්ට සිදුවිය හැක. අනුමත සේවක සංඛ්‍යාව තුළ සේවය කරනු ලබන විට III ශ්‍රේණියේ නිලධාරීන් වැඩ බැලීමේ පදනම මත II ශ්‍රේණියේ තනතුරු සඳහා පත් නොකළ යුතුය.

2 ශ්‍රී ලංකා සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණය වීමට යටත්ව

3 තනතුර දරන්නාට පෞද්ගලික වන සේ හා පසුව අහෝසි වීමට යටත්ව

4 තනතුර දරන්නාට පෞද්ගලික වන සේ හා පසුව අහෝසි වීමට යටත්ව නිර්දේශ කරන අතර, මෙම තනතුර අහෝසි වීමෙන් පසු "පෙර මුද්‍රණ සැලසුම්කරු" යන තනතුරු නාමය සහ MT 1-2006A වැටුප් පරිමාණ යටතේ නව තනතුරු 03 ක් නිර්දේශ කෙරේ.

5 තනතුර දරන්නාට පෞද්ගලික වන සේ හා පසුව අහෝසි වීමට යටත්ව නිර්දේශ කරන අතර, මෙම තනතුර අහෝසි වීමෙන් පසු "ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරු" යන තනතුරු නාමය සහ MT 1-2006A වැටුප් පරිමාණය සඳහා නව තනතුරු 04 ක් බඳවා ගැනීම සිදුකිරීම නිර්දේශ කෙරේ.

6 තනතුර දරන්නාට පෞද්ගලික වන සේ හා පසුව අහෝසි වීමට යටත්ව නිර්දේශ කරන අතර, මෙම තනතුර

අහෝසි වීමෙන් පසු "කොම්පියුටර් ටයිප් සෙටර්/රටා සිත්තම්කරු" යන තනතුරු නාමය සහ MT 1-2006A වැටුප් පරිමාණ යටතේ නව තනතුරු 02 ක් නිර්දේශ කෙරේ.

7 අනුමත සංඛ්‍යාලේඛනඥ තනතුරු 200 ක් තුළ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ තනතුරු 37 ද ඇතුළත්ව ඇති බැවින් බඳවා ගැනීම් කිරීමේදී පුරප්පාඩු සංඛ්‍යාව සැලකිය යුත්තේ එම තනතුරු දෙක ම සඳහා ඒකාබද්ධ සේවක සංඛ්‍යාව 200 ක් සේ සලකමිනි.

## 3.3 විදේශ සම්මේලන, සම්මන්ත්‍රණ හා වැඩමුළුවලට සහභාගිවීම - 2016

| | නම | සම්මේලන/සම්මන්ත්‍රණ/වැඩමුළු |
|---|---|---|
| 1 | කේ.එම්.ඩී.එස්.ඩී. කරුණාරත්න මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2016 ජනවාරි 12 සිට 18 දක්වා ජපානයේ පැවැති ජාතික ගිණුම් ක්‍රමය පිළිබඳ පුහුණුව |
| 2 | එම්.එල්. ඒ.පී. ගුණසේකර මිය<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2016 ජනවාරි 11 සිට 22 දක්වා පිලිපීනයේ පැවැති ප්‍රජා විද්‍යාත්මක විශ්ලේෂණය හා ජනගහන පුරෝකථන පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව |
| 3 | ඕ.ආර්. විජේගුණසිංහ මිය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2016 ජනවාරි 11 සිට 22 දක්වා පිලිපීනයේ පැවැති ප්‍රජා විද්‍යාත්මක විශ්ලේෂණය හා ජනගහන පුරෝකථන පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව |
| 4 | වී.ටී. අනුරුද්ධ මයා<br>සංඛ්‍යාලේඛන සහකාර | 2016 ජනවාරි 11 සිට 22 දක්වා පිලිපීනයේ පැවැති ප්‍රජා විද්‍යාත්මක විශ්ලේෂණය හා පුරෝකථන පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව |
| 5 | බී.ඒ.යු. වර්ණසිරි මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2016 ජනවාරි 21 සිට 22 දක්වා කාම්බෝඩියාවේ පැවැති ප්‍රශස්ථ ආර්ථික තීරන ගැනීම සඳහා සාර්ව ආර්ථික සංඛ්‍යාන හා ශේෂ පත්‍ර පිවිසුම ඒකාබද්ධව ධාරිතාව ඉහල නැංවීමේ සම්මන්ත්‍රණය |
| 6 | පී.ඩී.ඩී. පීරිස් මයා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) | 2016 පෙබරවාරි 15 සිට 16 දක්වා පකිස්ථානයේ පැවති SAARC STAT අන්තර්ජාල ගිණුම යාවත්කාලීන කිරීම පිළිබඳ SAARC – ADB 1 වන පුහුණු පාඨමාලාව |
| 7 | ජී.ඩී.පී.ටී. ගුණතිලක මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2016 පෙබරවාරි 15 සිට 16 දක්වා පකිස්ථානයේ පැවැති SAARC STAT අන්තර්ජාල ගිණුම යාවත්කාලීන කිරීම පිළිබඳ SAARC – ADB 1 වන පුහුණු පාඨමාලාව |
| 8 | කේ.ආර්. යු.එස්. බණ්ඩාර මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2016 මාර්තු 29 සිට අප්‍රේල් 01 දක්වා මොන්ගෝලියාවේ පැවැති හරිත ආර්ථික දර්ශකයන් පිළිබඳ සංවර්ධන ගිණුම් ව්‍යාපෘතිය |
| 9 | ආර්.එච්.එස්. අබේනායක මයා<br>අධ්‍යක්ෂ | 2016 පෙබරවාරි 29 සිට මාර්තු 03 දක්වා ජපානයේ පැවැති නිල සංඛ්‍යාති සඳහා නිලධාරීන් පුහුණු කිරීමේ කලාපීය වැඩමුළුව |
| 10 | ඩබ්ලිව්. ඒ.සී. විජේබණ්ඩාර මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2016 මාර්තු 14 සිට 18 දක්වා ඉතාලියේ පැවැති පාසැල් අධ්‍යාපනයෙන් පසු රැකියාවකට යොමුවීම පිළිබඳව මූලාශ්‍ර මත පදනම්වූ ප්‍රතිපත්තියක් සඳහා දත්ත විශ්ලේෂණය කිරීමේ වැඩමුළුව |
| 11 | ආචාර්ය ඒ.ජේ. සතරසිංහ මයා<br>අධ්‍යක්ෂ ජනරාල් | 2016 මැයි 02 සිට 04 දක්වා තායිලන්තයේ පැවැති ආසියා සහ ශාන්තිකර කලාපීය ආර්ථික සංඛ්‍යාන සතිය |
| 12 | ඩී.එන් . මුණසිංහ මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2016 මැයි 02 සිට 04 දක්වා තායිලන්තයේ පැවැති ආසියා සහ ශාන්තිකර කලාපීය ආර්ථික සංඛ්‍යාන සතිය |

| | | |
|---|---|---|
| 13 | වයි. පී. රාජපක්ෂ මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2016 මාර්තු 07 සිට 08 දක්වා ඉන්දුනීසියාවේ පැවැති කුඩා පරිමාණ ධීවර හා දත්ත එකතු කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා වූ කලාපීය වැඩ මුළුව |
| 14 | යූ.එල්.කේ. පෙරේරා මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2016 මාර්තු 07 සිට 08 දක්වා ඉන්දුනීසියාවේ පැවැති කුඩා පරිමාණ ධීවර හා දත්ත එකතු කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා වූ කලාපීය වැඩ මුළුව |
| 15 | එම්.ඩී. සුනිල් සේනානායක මයා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2016 මැයි 23 සිට 25 දක්වා චීනයේ පැවැති බල ශක්ති සංඛ්‍යාති සහ බලශක්ති තුලනය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව |
| 16 | අයි.ජේ.එම්. ප්‍රනාන්දු මිය,<br>අධ්‍යක්ෂ | 2016 අප්‍රේල් 18 සිට 22 දක්වා මැලේසියාවේ විවෘත විශ්ව විද්‍යාලයේ පැවැති කළමනාරකරණ කුසලතා සංවර්ධන වැඩසටහන |
| 17 | ඩී.ජී.එස්.ජී. මුණසිංහ මයා<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2016 මැයි 02 සිට 09 දක්වා මැලේසියාවේ පැවැති ප්‍රතිපත්ති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා ඇගයීම පිළිබඳ ජාත්‍යන්තර වැඩසටහන |
| 18 | ඩී.ඩී. බස්නායක මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2016 අප්‍රේල් 27 සිට 29 දක්වා තායිලන්තයේ පැවැති ළමයින්ට සිදුවන මානසික හා ශාරිරික හානි පිළිබඳ 2 වන තාක්ෂණික වැඩසටහන |
| 19 | කේ.එස්.ජී. තිලකරත්න මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2016 අප්‍රේල් 27 සිට 29 දක්වා තායිලන්තයේ පැවැති ළමයින්ට සිදුවන මානසික හා ශාරිරික හානි පිළබඳ 2 වන තාක්ෂණික වැඩසටහන |
| 20 | අයි.ආර්. බණ්ඩාර මිය<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2016 සැප්තැම්බර් 07 සිට 19 දක්වා ඇමෙරිකා එක්සත් ජනපදයේ පැවැති 28 වන ජන සංගණන සඳහා වූ සම්මන්ත්‍රණය |
| 21 | ජේ.එම්.එස්.යු.බී. ජයමහ මයා,<br>සංඛ්‍යාලේඛනඥ | 2016 ජූලි 07 සිට 08 දක්වා පිලිපීනයේ පැවති තිරසාර සංවර්ධන ඉලක්කවලට සහයවීම සඳහා දත්ත රැස්කිරීම හා ජාතික සමීක්ෂණ කළමනාකරණය වැඩි දියුණු කිරීමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික ක්‍රම ක්‍රියාත්මක කිරීම |
| 22 | ඩී.ආර්.එම්.සී.එම්. රත්නායක මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2016 ජූලි 07 සිට 08 දක්වා පිලිපීනයේ පැවති තිරසාර සංවර්ධන ඉලක්කවලට සහයවීම සඳහා දත්ත රැස්කිරීම හා ජාතික සමීක්ෂණ කළමනාකරණය වැඩි දියුණු කිරීමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික ක්‍රම ක්‍රියාත්මක කිරීම |
| 23 | ඒ.එම්. පී. අබේසිංහ මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2016 ජුනි 27 සිට ජූලි 01 දක්වා දකුණු කොරියාවේ පැවති සන්නිවේදනය හා කෘෂිකාර්මික සංඛ්‍යාන පිළිබඳ කලාපීය පුහුණු පාඨමාලාව |
| 24 | ජී.කේ.ඩී.එච්. මැණිකේ මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2016 ජුනි 27 සිට ජූලි 01 දක්වා දකුණු කොරියාවේ පැවැති සන්නිවේදනය හා කෘෂිකාර්මික සංඛ්‍යාන පිළිබඳ කලාපීය පුහුණු පාඨමාලාව |
| 25 | ටී.ජේ.ජේ.පී. එගොඩවත්ත මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2016 මැයි 09 සිට 11 දක්වා තායිලන්තයේ Bloomberg D4H කලාපීය පෙල ගැස්ම සහ ව්‍යාපාර වාස්තු විද්‍යාව පිළිබඳ පුහුණු වැඩ මුළුව |
| 26 | ඒ.ජී.එස්. කාරියවසම් මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2016 ජුනි 06 සිට 10 දක්වා තායිලන්තයේ පැවැති 2015 – 2016 මිලදී ගැනීමේ හැකියාවන් පිළිබඳ දෙවන කලාපීය පුහුණු හා තාක්ෂණික ඇගයීම් වැඩමුළුව |

| | | |
|---|---|---|
| 27 | ඩී.ඩී.ජී.ඒ. සෙනෙවිරත්න මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2016 ජූලි 12 දින සිංගප්පූරුවේ පැවැති මධ්‍ය ආදායම් රටවල් සහභාගිත්වයෙන් නාගරිකකරණය අධ්‍යයනය පිළිබඳ පුහුණුව |
| 28 | බී.ඒ.යූ. වර්ණසිරි මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2016 ජූනි 27 සිට ජූලි 01 දක්වා තායිලන්තයේ පැවැති සැපයුම් හා භාවිතා වගු වලංගුභාවය පිළිබඳ වැඩමුළුව හා සැපයුම් හා භාවිතා වගු යාවත්කාලීන කිරීමේ පුහුණුව |
| 29 | ජේ.එස්.එන්.පී. ධර්මවර්ධන මයා<br>ජ්‍යොෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2016 අගෝස්තු 30 සිට සැප්තැම්බර් 01 දක්වා අයර්ලන්තයේ පැවැති නිල සංඛ්‍යාති සඳහා Big – data පිළිබඳ තුන්වන අන්තර්ජාතික සමුළුව |
| 30 | පී.එම්.ආර්. ප්‍රනාන්දු මයා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2016 ජූලි 25 සිට 31 දක්වා කොරියාවේ පැවැති ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (DCS) සඳහා CAPI මත පදනම්වූ සඳහා දත්ත යෙදවුම් පද්ධතිය ස්ථාපිත කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන |
| 31 | ඩබ්ලිව්.එච්.පී. ඩබ්ලිව් වීරසිරි මයා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2016 ජූලි 25 සිට 31 දක්වා කොරියාවේ පැවැති ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (DCS) සඳහා CAPI මත පදනම්වූ සඳහා දත්ත යෙදවුම් පද්ධතිය ස්ථාපිත කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන |
| 32 | කේ.එම්.ආර්. වික්‍රමසිංහ මයා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2016 ජූලි 25 සිට 31 දක්වා කොරියාවේ පැවැති ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (DCS) සඳහා CAPI මත පදනම්වූ සඳහා දත්ත යෙදවුම් පද්ධතිය ස්ථාපිත කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන |
| 33 | කේ.එල්.සී.එස්. වීරසූරිය මයා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2016 ජූලි 25 සිට 31 දක්වා කොරියාවේ පැවැති ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (DCS) සඳහා CAPI මත පදනම්වූ සඳහා දත්ත යෙදවුම් පද්ධතිය ස්ථාපිත කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන |
| 34 | පී.ඩී.ඩී. පීරිස් මයා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2016 ජූලි 25 සිට 31 දක්වා කොරියාවේ පැවැති ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (DCS) සඳහා CAPI මත පදනම්වූ සඳහා දත්ත යෙදවුම් පද්ධතිය ස්ථාපිත කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන |
| 35 | ආර්.එම්.ඩී. ඒකනායක මයා<br>සහකාර අධ්‍යක්ෂ | 2016 ජූලි 25 සිට 31 දක්වා කොරියාවේ පැවැති ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (DCS) සඳහා CAPI මත පදනම්වූ සඳහා දත්ත යෙදවුම් පද්ධතිය ස්ථාපිත කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන |
| 36 | එච්.ටී. ෆොන්සේකා මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2016 ජූලි 25 සිට 31 දක්වා කොරියාවේ පැවැති ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (DCS) සඳහා CAPI මත පදනම්වූ සඳහා දත්ත යෙදවුම් පද්ධතිය ස්ථාපිත කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන |
| 37 | එස්. පුන්ගුන්රන් මයා<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2016 ජූලි 25 සිට 31 දක්වා කොරියාවේ පැවැති ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (DCS) සඳහා CAPI මත පදනම්වූ සඳහා දත්ත යෙදවුම් පද්ධතිය ස්ථාපිත කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන |
| 38 | ආර්.එම්.සී. ඩී. සේරම් මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2016 ජූලි 26 සිට 28 දක්වා තායිලන්තයේ පැවැති 2020 න්‍යාය පත්‍රයෙහි තිරසාර සංවර්ධනය සහ 2020 ලෝක ජනගහන හා නිවාස සංගණන වැඩසටහනට සහය වීම සඳහා බාධක මිනුම් සහ සංඛ්‍යාති පිළිබඳ එක්සත් ජාතීන්ගේ කලාපීය රැස්වීම |

| | | |
|---|---|---|
| 39 | පී.එම්.පී. අනුර කුමාර මයා<br>අධ්‍යක්ෂ | 2016 සැප්තැම්බර් 19 සිට 23 දක්වා තායිලන්තයේ පැවැති 2020 කෘෂිකාර්මික සංගණනය සඳහා ලෝක වැඩසටහන පිළිබඳ වට මේස සාකච්ඡාව |
| 40 | ආචාර්ය ඒ.ජේ. සතරසිංහ මයා<br>අධ්‍යක්ෂ ජනරාල් | 2016 අගෝස්තු 29 සිට 31 දක්වා ඉන්දියාවේ පැවැති SAARC සංඛ්‍යාන සංවිධානයේ ප්‍රධානීන්ගේ 8 වන රැස්වීම |
| 41 | යූ. මහේස්වරන් මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2016 අගෝස්තු 29 සිට 31 දක්වා ඉන්දියාවේ පැවැති SAARC සංඛ්‍යාන සංවිධානයේ ප්‍රධානීන්ගේ 8 වන රැස්වීම |
| 42 | කේ.එම්.ඩී.එස්.ඩී කරුණාරත්න මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2016 අගෝස්තු 29 සිට 31 දක්වා ඉන්දියාවේ පැවැති සංඛ්‍යානය පිළිබඳ SAARC සංවිධාන ප්‍රධානීන්ගේ 8 වන රැස්වීම |
| 43 | පී.එල්.ඒ.ඒ. හේමන්ත මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2016 ඔක්තෝබර් 10 සිට 12 දක්වා කොරියාවේ පැවැති ආසියා - පැසිපික් කලාපීය ජාත්‍යන්තර කම්කරු සංක්‍රමණ දත්ත රැස් කිරීම පිළිබඳ දෙවන වැඩමුළුව |
| 44 | එස්.සී. වික්‍රමාරච්චි මිය<br>සංඛ්‍යාලේඛන සහකාර | 2016 ඔක්තෝබර් 10 සිට 12 දක්වා කොරියාවේ පැවැති ආසියා - පැසිපික් කලාපීය ජාත්‍යන්තර කම්කරු සංක්‍රමණ දත්ත රැස් කිරීම පිළිබඳ දෙවන වැඩමුළුව |
| 45 | ආර්.එම්.එම්.කේ.ඒකනායක මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2016 අගෝස්තු 22 සිට 30 දක්වා කොරියාවේ පැවැති දල දේශීය නිෂ්පාදිතයේ ආවරණය පුළුල් කිරීම පිළිබඳ SNA 2008 කලාපීය පාඨමාලාව |
| 46 | ඩී.ජී.එස්.ජී. මුණසිංහ මයා<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 2016 අගෝස්තු 24 සිට 26 දක්වා තායිලන්තයේ පැවැති තිරසාර සංවර්ධනය සඳහා 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා නිල සංඛ්‍යාති පරිවර්තනය කිරීම පිළිබඳ ආසියා - පැසිපික් සම්මේලනය |
| 47 | කේ.එම්.එම්. කුමාරිහාමි මිය<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(පාලන) | 2016 සැප්තැම්බර් 20 සිර 26 දක්වා මැලේසියාවේ පැවැති කළමනාකරණ හැකියාව සංවර්ධනය කිරීමේ වැඩසටහන |
| 48 | ආචාර්ය ඒ.ජේ.සතරසිංහ මයා<br>අධ්‍යක්ෂ ජනරාල් | 2016 සැප්තැම්බර් 05 සිට 09 දක්වා ඉන්දියාවේ පැවැති තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සඳහා තොරතුරු හා දත්ත හා පිළිබඳ උප- කලාපීය වැඩමුළුව |
| 49 | ජේ.කේ.බී.එන්.ජයකොඩි මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2016 සැප්තැම්බර් 12 සිට 16 දක්වා පිලිපීනයේ පැවැති 2015 – 2016 මිලදී ගැනීමේ හැකියාව පිළිබඳ තුන්වන තාක්ෂණික ඇගයීම් හා කලාපීය පුහුණු වැඩසටහන |
| 50 | ඕ.එම්.පී. කුමාර මයා<br>සංඛ්‍යාලේඛන සහකාර | 2016 ඔක්තෝබර් 10 සිට 21 දක්වා ඉන්දුනිසියාවේ පැවැති කෘෂිකාර්මික හා ග්‍රාමීය සංඛ්‍යාති සඳහා ප්‍රධාන දත්ත නිපදවීමට නියැදි ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන |
| 51 | කේ.එම්.එස්. විමලරත්න මිය<br>සංඛ්‍යාලේඛන නිලධාරි | 2016 ඔක්තෝබර් 10 සිට 21 දක්වා කොරියාවේ පැවැති සංඛ්‍යාන ධාරිතාවය ඉහල දැමීම සඳහා වූ සමාජ සංඛ්‍යානය පිළිබඳ පුහුණු පාඨමාලාව |
| 52 | එම්. ජේ.මාකස් ප්‍රනාන්දු මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2016 සැප්තැම්බර් 13 සිට 28 දක්වා චීනයේ පැවැති ආසියා හා යුරෝපීය රටවල විදුලි සංදේශ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය |
| 53 | ඩී.එල්.එදිරිසිංහ මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2016 සැප්තැම්බර් 13 සිට 28 දක්වා චීනයේ පැවැති ආසියා හා යුරෝපීය රටවල විදුලි සංදේශ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය |

| | | |
|---|---|---|
| 54 | ඊ.ඒ.ඒ.පී. එගොඩවත්ත මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2016 ඔක්තෝබර් 05 සිට 07 දක්වා තායිලන්තයේ පැවැති SDG අධීක්ෂණය සඳහා කලාපීය ධාරිතාව ඉහල නැංවීමේ වැඩමුළුව |
| 55 | එස්.එම්.එච්.එන්. සමරකෝන් මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2016 ඔක්තෝබර් 05 සිට 06 දක්වා පිලිපීනයේ පැවැති ආපදා සම්බන්ධ සංඛ්‍යාති පිළිබඳ විශේෂඥ කණ්ඩායමේ සිව්වන රැස්වීම |
| 56 | ටී.ඩී.එම්.එස්.ඩී. පෙරේරා මයා<br>සංඛ්‍යාලේඛනඥ | 2016 නොවැම්බර් 30 සිට දෙසැම්බර් 02 දක්වා තායිලන්තයේ පැවැති ආර්ථික සංඛ්‍යාති පිළිබඳ කලාපීය වැඩමුළුව : සංඛ්‍යාන ව්‍යාපාරික නාමාවලිය පිළිබඳ ව්‍යාපෘති රැස්වීම හා වැඩමුළුව |
| 57 | එම්.ජී.ඩබ්.අයි. ශ්‍යාමලි මෙය<br>සංඛ්‍යාලේඛන නිලධාරී | 2016 නොවැම්බර් 30 සිට දෙසැම්බර් 02 දක්වා තායිලන්තයේ පැවැති ආර්ථික සංඛ්‍යාති පිළිබඳ කලාපීය වැඩමුළුව : සංඛ්‍යාන ව්‍යාපාරික නාමාවලිය පිළිබඳ ව්‍යාපෘති රැස්වීම හා වැඩමුළුව |
| 58 | කේ.ඒ.එස්.පී. කොඩිකාර මිය<br>සංඛ්‍යාලේඛනඥ | 2016 නොවැම්බර් 07 සිට 11 දක්වා ජපානයේ පැවැති දියුණු වෙමින් පවතින රටවල් සඳහා සංඛ්‍යාන ව්‍යාපාරික නාමාවලිය පිළිබඳ වැඩමුළුව |
| 59 | එස්. තනබාලසිංගම් මයා<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2016 නොවැම්බර් 21- 25 දක්වා කොරියාවේ පැවැති කෘෂිකාර්මික නිෂ්පාදන සංඛ්‍යාති වියදම් පිළිබඳ කලාපීය පුහුණු පාඨමාලාව |
| 60 | ඩී.එම්.කේ.පී.කේ. දිසානායක මයා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2016 නොවැම්බර් 09 සිට 11 දක්වා ඉන්දියාවේ පැවැති පෞද්ගලික ආහාර ධාන්‍ය තොග මැනීම සඳහා පිවිසීම හා ක්‍රමෝපාය පිළිබඳ සම්මන්ත්‍රණය |
| 61 | සී.ඩී.ද සිල්වා මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2016 නොවැම්බර් 15 සිට 17 දක්වා තායිලන්තයේ පැවැති ආසියා පැසිපික් කලාපීය තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා ස්ත්‍රී පුරුෂ සමානත්මතාවය සහ ප්‍රාදේශීයකරණය සාක්ෂි මූලික ප්‍රතිපත්ති වලට පක්ෂව කතා කරන මූලික ප්‍රකාශනයක් වැඩි දියුණු කිරීම පිළිබඳව ආසියා - පැසිපික් කලාපීය උපදෙස් ලබා දීම පිළිබඳ පුහුණුව |
| 62 | ආචාර්ය ඒ.ජේ. සතරසිංහ මයා<br>අධ්‍යක්ෂ ජනරාල් | 2016 දෙසැම්බර් 14 සිට 16 දක්වා තායිලන්තයේ පැවැති තිරසාර සංවර්ධනය සඳහා 2030 හි න්‍යාය පත්‍රය සඳහා නිල සංඛ්‍යාති දියුණු කිරීම පිළිබඳ කමිටුවේ 5 වන සැසිවාරය |
| 63 | වයි.ජී.ආර්.අයි. කුලතිලක මිය<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2016 නොවැම්බර් 15 සිට 17 දක්වා තායිලන්තයේ පැවැති කෘෂිකාර්මික හා ග්‍රාමීය සංඛ්‍යාති වැඩිදියුණු කිරීමේ ගෝලීය උපක්‍රම සඳහා ආසියා හා පැසිපික් කලාපීය කමිටුවේ 6 වන රැස්වීම |
| 64 | වයි.ජී.ආර්.අයි. කුලතිලක මිය<br>ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 2016 නොවැම්බර් 21 සිට 25 දක්වා වියට්නාමයේ පැවැති ආසියා - පැසිපික් ඇගයීම් සංගම් සමුළුව |
| 65 | ඩී.ඩී.ජී.ඒ. සෙනවිරත්න මිය<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ | 2016 දෙසැම්බර් 12 සිට 13 දක්වා තායිලන්තයේ පැවැති ආසියාව හා පැසිපික් කලාපය සඳහා සංඛ්‍යාන ආයතනවල පාලන කවුන්සිලයේ 12 වන සැසිවාරය |

## 3.4 උසස්වීම්, පත්වීම්, මුදාහැරීම්, ඉල්ලා අස්වීම්, සේවය අතහැරයෑම් හා විශ්‍රාමයෑම්

**උසස් කිරීම්**

| | |
|---|---|
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(සංඛ්‍යාන) | 01 |
| අධ්‍යක්ෂ(සංඛ්‍යාන) | 08 |

**පත් කිරීම්**

| | |
|---|---|
| සංඛ්‍යාලේඛනඥ | 01 |
| කාර්යාල කාර්ය සහායක | 15 |
| කාර්යාල කාර්ය සහායක(අනියම්) | 02 |
| රියදුරු(අනියම්) | 02 |

**මුදාහැරීම්**

| | |
|---|---|
| සංඛ්‍යාලේඛන සහකාර | 01 |
| දත්ත සටහන් ක්‍රියාකරු | 01 |
| කාර්යාල කාර්ය සහායක | 01 |

**සේවය අතහැරයෑම්**

| | |
|---|---|
| සංඛ්‍යාලේඛන සහකාර | 01 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 01 |
| දත්ත සටහන් ක්‍රියාකරු | 01 |
| කේත ලිපිකරු(සිංහල මාධ්‍ය) | 01 |
| කාර්යාල කාර්ය සහායක | 01 |
| කාර්යාල කාර්ය සහායක(දෙපාර්තමේන්තුගත) | 01 |

**විශ්‍රාමයෑම්**

| | |
|---|---|
| අධ්‍යක්ෂ(සංඛ්‍යාන) | 02 |
| අධ්‍යක්ෂ(තොරතුරු තාක්ෂණ) | 01 |
| ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාලේඛනඥ | 05 |
| සංඛ්‍යාලේඛනඥ | 04 |
| සංඛ්‍යාලේඛන නිලධාරී | 07 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 03 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 05 |
| ජ්‍යෙෂ්ඨ පද්ධති ක්‍රියාකරු | 01 |
| පොත් බැඳුම්කරු (මුද්‍රණ) | 01 |
| රියදුරු | 01 |

**ස්ථාන මාරු**

| | |
|---|---|
| සහකාර අධ්‍යක්ෂ(තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) | 01 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | 14 |
| සංවර්ධන නිලධාරි | 11 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 45 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 53 |
| රියදුරු | 14 |
| කාර්යාල කාර්ය සහායක | 24 |

| | |
|---|---|
| උපාධිධාරී අභ්‍යාසලාභී | 04 |

**සේවයෙන් ඉල්ලා අස්වීම්**

| | |
|---|---|
| සංඛ්‍යාලේඛන නිලධාරී | 03 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 01 |

**ජීවිතක්ෂයට පත්වීම**

| | |
|---|---|
| සංඛ්‍යාලේඛන නිලධාරී | 01 |

## 3.5 අභ්‍යන්තර විගණන කටයුතු

2016 වර්ෂයේදී අභන්තර විගණන අංශය මගින් සිදු කල කාර්ය සාධනය පහත පරිදි වේ.

- 2016 වර්ෂයට අදාල අභ්‍යන්තර විගණන වැඩසටහන සකස් කර ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ට හා විගණකාධිපති වෙත යවන ලදී.
- 2016 වර්ෂයට අදාල මූලික වාර්තාව ඉදිරිපත් කිරීම.
- පහත සඳහන් දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශ වල සාමාන්‍ය පරිපාලනය පිළිබඳ පරීක්ෂා කර වාර්තා ඉදිරිපත් කරන ලදී. ගම්පහ, කෑගල්ල, රත්නපුරය, කුරුණෑගල, කළුතර, ගාල්ල හා අධ්‍යාපන අමාත්‍යාංශයේ දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශය.
- පුහුණු අංශයේ නිවාඩු හා පුහුණු වැඩසටහන් පැවැත්වීම පිළිබඳ පරීක්ෂාව.
- දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගබඩා අංශය, නියදි සමීක්ෂණ අංශය, සිතියම් හා විද්‍යා අංශය, පුස්තකාල අංශය, දත්ත නිකුත් කිරීමේ අංශය, ආයතන අංශය, කර්මාන්ත ඉදිකිරීම් වෙළඳ හා සේවා අංශය, ගිණුම් අංශය යන අංශ වල නිලධාරීන්ගේ නිවාඩු පරීක්ෂා කර වාර්තා ඉදිරිපත් කිරීම.
- බැංකු සැසඳුම් හා මුදල් පොත් නියදි පරීක්ෂාව.
- 2015 වර්ෂයේ ඔක්තොම්බර් මස වවුචර පත්, මුදල් පොත්, වැය ලෙජර ආශ්‍රිත පරීක්ෂාව. 2016 වර්ෂයේ බැංකු සැසඳුම්, මුදල් පොත්, වැය ලෙජර, පොදු තැන්පත් ගිණුම, ගිණුම් සාරාංශ නියදි පරීක්ෂාව. 2015 වර්ෂයේ විසර්ජන ගිණුම හා බැරකම් පරීක්ෂාව.
- භාණ්ඩ සමීක්ෂණ වාර්තා, ඉන්වෙන්ට්‍රි ලේඛන පරීක්ෂා කිරීම. ප්‍රකාශන අංශය, ජාතික ගිණුම් අංශය, නියදි සමීක්ෂණ අංශය, සිතියම් විද්‍යා අංශය, කෘෂිකාර්මික හා පාරිසරික අංශය, කර්මාන්ත ඉදිකිරීම් වෙළඳ හා සේවා අංශය, පුහුණු අංශය, ආයතන අංශය යන අංශ වල බඩු වට්ටෝරු ලේඛන, භාණ්ඩ සමීක්ෂණ වාර්තා පරීක්ෂා කර ඌනතා හා අතිරික්තතා පිළිබඳ වාර්තා කරන ලදී.
- 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ හා ප්‍රසම්පාදන සැලැස්මේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය පරීක්ෂා කර වාර්තා කිරීම. 2015 ක්‍රියාකාරී සැලැස්ම හා කාර්යසාධන වාර්තාව පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කිරීම.
- 2015 වර්ෂයේදී මිලදී ගත් ටයර් වලට අදාල ලිපිගොනු පරීක්ෂා කිරීම, නිකුත් කිරීම හා ලොග් පොත් වල ඇතුලත් කිරීම පරීක්ෂා කිරීම, වාහන අළුත්වැඩියා ලොග් පොත් වල ඇතුලත් කිරීම පරීක්ෂා කිරීම. ෆැක්ස් යන්ත්‍ර හා ඡායා පිටපත් යන්ත්‍ර මිලට ගැනීම හා නඩත්තු කිරීම පිළිබඳ පරීක්ෂාව. ප්‍රධාන ගබඩාවේ ලේඛන හා තොග පරීක්ෂාව. පරිලෝඛන යන්ත්‍ර වල ක්‍රියාකාරීත්වය හා සේවා ගිවිසුම් අනුව සේවා කටයුතු සිදු කර ඇත්දැයි පරීක්ෂාව.
- පුස්තකාලයේ පොත් මිලදී ගැනීම, ඉන්වෙන්ට්‍රි ගත කිරීම, පොත් සංරක්ෂණය යන කාර්යයන් වල ප්‍රගතිය පරීක්ෂාව හා පොත් සමීක්ෂණය පිළිබඳ විගණන පරීක්ෂාව.
- රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් B ගිණුම පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.
- කෘෂිකර්ම හා පාරිසරික අංශයෙන් සිදු කරන කෘෂිකර්ම සංගණය 2013/14 හි මූල්‍ය හා භෞතික ප්‍රගතිය පරීක්ෂා කිරීම.

- ප්‍රජා විද්‍යාත්මක හා සෞඛ්‍ය සමීක්ෂණයේ සමීක්ෂණය කළ යුතු නිවාස ඒකක ලයිස්තු වලට අදාල ගොනු නියදි පරීක්ෂාව. ගෙවීම් වවුචර නියදි පරීක්ෂාව. පුහුණු පංති පැවැත්වීමේ පිරිවැය වවුචර නියදි පරීක්ෂාව.
- වාර්ෂික කර්මාන්ත හා වාර්ෂික ඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණ වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය පරීක්ෂා කර වාර්තා කිරීම.
- කාර්යක්ෂම දිස්ත්‍රික් කාර්යාලය තේරීමේ ක්‍රියාවලිය හා දිස්ත්‍රික් සංඛ්‍යාන අත්පොත් සකස් කිරීමේ ක්‍රියාවලියේ ප්‍රගතිය පරීක්ෂා කර බලා වාර්තා කිරීම.
- තේ, පොල්, රබර් නිෂ්පාදන වියදම් ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණයේ ප්‍රගතිය පරීක්ෂා කර බලා වාර්තා කිරීම.
- ආයතන අංශයේ පෞද්ගලික ලිපිගොනු නියදි පරීක්ෂාව. වැටුප් වර්ධක හා කාර්යසාධන වාර්තා ඉදිරිපත් කිරීම නියදි පරීක්ෂාව. වැටුප් ලෙජර පරීක්ෂාව. අතිකාල ගෙවීම්, වැටුප් රහිත නිවාඩු අය කිරීම් නියදි පරීක්ෂා කර වාර්තා කිරීම. දෙපාර්තමේන්තුව සතු වාහන භාවිතය හා නඩත්තු කටයුතු පරීක්ෂා කිරීම.
- 2016 වර්ෂය සඳහා විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 4ක් පැවැත්වීම.

## 4. මූල්‍ය වාර්තාව - 2016

2016 වර්ෂය සඳහා අදාල සීමාවන් යටතේ වන මුළු ඇස්තමේන්තුගත වියදම රු.1,134,742,040 (මිලියන 1,134.74)කි. මේ අතරින් රු.857,980,000 (මිලියන 857.98) ක් පුනරාවර්තන වියදම් ඇස්තමේන්තු වන අතර රු.276,762,040 ක්(මිලියන 276.76) ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුවේ. "පුනරාවර්තන වියදම් 2016" වගුව අනුව සත්‍ය වශයෙන් දරන ලද පුනරාවර්තන වියදම රු. 838,283,719 (මිලියන 838.28)ක් වේ. "ප්‍රාග්ධන වියදම් 2016" වගුවෙහි දක්වා ඇති පරිදි සත්‍ය වශයෙන් දරන ලද ප්‍රාග්ධන වියදම රු. 249,630,348 (මිලියන 249.63) කි.

ඉහත වර්ගකිරීම් යටතේ ඇස්තමේන්තුගත වියදම හා සත්‍ය වියදම අතර සුළු වෙනසක් දැකිය හැකි අතර ඊට හේතු පහත දැක්වේ.

පුනරාවර්තන වියදම්: ඇස්තමේන්තු වියදම හා සත්‍ය වියදම අතර වෙනස

- වර්ෂය තුල කුලී පදනම මත වාහන ලබා ගැනීමට අවශ්‍ය නොවීම
- ගෙවීමට තිබූ වවුචර සඳහා අක් මුදල් ප්‍රමාණවත් නොවීම

ප්‍රාග්ධන වියදම්: ඇස්තමේන්තු වියදම හා සත්‍ය වියදම අතර වෙනස

- අපේක්ෂිත පරිදි යන්ත්‍ර වල විශාල අළුත්වැඩියා සිදු කිරීමට අවශ්‍ය නොවීම
- ඇස්තමේන්තු කල කාර්යය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොවීම
- ගෙවීමට තිබූ වවුචර සඳහා ප්‍රමාණවත් පරිදි අක් මුදල් නොලැබීම
- විදේශ ප්‍රදානයක් යටතේ ලැබී තිබූ මුළු මුදලටම ප්‍රතිපාදන වෙන් කිරීම

ශීර්ෂය :252 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වැඩ සටහන : 01 මෙහෙයුම් වැඩ සටහන

ව්‍යාපෘතිය : පරිපාලනය සහ ජාතික සංඛ්‍යාලේඛන

**පුනරාවර්තන වියදම් 2016**

| ව්‍යාපෘතිය | වැය විෂයය | 2016 ඇස්තමේන්තුව (මුළු ශුද්ධ වෙන්කිරීම) රුපියල් | 2016 සත්‍ය වියදම රුපියල් |
|---|---|---|---|
| 1 | 1. පුද්ගලික පඩිනඩි | 694,000,000.00 | 689,846,816.00 |
| | 2. වෙනත් පුනරාවර්තන වියදම් | 163,980,000.00 | 148,436,903.00 |
| | **එකතුව** | **857,980,000.00** | **838,283,719.00** |

**ප්‍රාග්ධන වියදම් 2016**

| ව්‍යාපෘතිය | වැය විෂයය | 2016 ඇස්තමේන්තුව (මුළු ශුද්ධ වෙන්කිරීම) රුපියල් | 2016 සත්‍ය වියදම රුපියල් |
|---|---|---|---|
| 1 | 1.මූලධන වත්කම්වල පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම | 6,500,000.00 | 5,356,182.00 |
| | 2. මූලධන වත්කම්වල අත්පත් කර ගැනීම | 207,553,225.00 | 186,995,843.00 |
| | වෙනත් මූලධන වියදම් | 62,708,815.00 | 57,278,323.00 |
| | **එකතුව** | **276,762,040.00** | **249,630,348.00** |

**ර.නි.අ.බි. ගිණුම 2520011 – 2016**

| | අනුමත සීමාව රුපියල් | සත්‍ය සීමාව රුපියල් |
|---|---|---|
| උපරිම හර සීමාව | 40,000,000.00 | 35,557,373.00 |
| උපරිම බැර සීමාව | 28,000,000.00 | 36,288,023.19 |
| හර ශේෂයේ උපරිම සීමාව | 220,000,000.00 | 141,333,974.41 |